සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය : ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය

University of Sri Jayewardenepura ;Department of Business Economics

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය

General Certificate of Education (Adv. Level) Examination

கல்விப் பொதுத் தராதப் பத்திர (உயர் தர)ப் பரீட்சை

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

උපදෙස්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (i), (ii), (iii), (iv), (v) යන පිළිතුරු අතරින් නිවැරදි හෝ ඉතා ආසන්න පිළිතුර තෝරන්න.
- කාලය පැය දෙකකි.

1) සූක්ෂම ආර්ථික විද්‍යාවට අයත් යථානුරූපී ප්‍රකාශය වන්නේ,

a) දරිද්‍රතාවය පිටුදැකීම සඳහා යෝග්‍යම ක්‍රමය දිළින්දන්ට සංක්‍රාම ලබාදීමයි.
b) රාජ්‍ය ව්‍යවසායකයන් කාර්යක්ෂම කිරීමට ඒවා පෞද්ගලීකරණය කිරීම යෝග්‍ය වේ.
c) ඕනෑම ආර්ථිකයක කේන්ද්‍රීය ආර්ථික ගැටලුව හිඟකමයි.
d) ආර්ථික වෘද්ධිය හා සේවා නියුක්තිය අතර අනුලෝම සම්බන්ධයක් පවතී.
e) ඉහළ මානව සංවර්ධන දර්ශකයක් සඳහා දිළිඳුකම තුරන් කළ යුතුය.

2) ආර්ථික නොවන සම්පත්වල ලක්ෂණයක් වන්නේ,

a) වුවමනාවන්ට සාපේක්ෂව සැපයුම සීමිත වේ.
b) මිලක් අය කළ හැකිවීම.
c) නිෂ්පාදන සාධක සඳහා වෙළඳපොළක් පැවතීම.
d) විකල්ප ප්‍රයෝජන ලබා ගත හැකිවීම.
e) හිඟකමක් හා ආවස්ථික පිරිවැයක් නොමැතිවීම.

3) X හා Y යන රටවල් දෙකට අදාළ නිෂ්පාදන හැකියා වක්‍ර පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.






iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

මෙම රටවල් දෙක සම්බන්දයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

a) රටවල් දෙකේම එක හා සමාන වූ ආවස්ථික පිරිවැයක් පවතී
b) රටවල් දෙකේම අනාගත වෘද්ධි අපේක්ෂා එක සමාන වේ
c) රටවල් දෙකේම ආවස්ථික පිරිවැය වැඩි වෙමින් පවතී
d) රටවල් දෙකේම එක හා සමාන වූ භාණ්ඩ කිසිවිටකත් නිපදවිය නොහැක.
e) ඇඟලුම් නිෂ්පාදනයේදී X රටේ ආවස්ථික පිරිවැය Y රටේ ආවස්ථික පිරිවැයට වඩා වැඩිය.

4) “දිට්වා” සුළි කුණාටුව නිසා බදුල්ල දිස්ත්‍රික්කයේ නිෂ්පාදන හැකියා වක්‍රයට වූ බලපෑම කුමක්ද?




5) වෙළඳපොළ ආර්ථිකයක හිතකර ලක්ෂණ මෙන්ම අහිතකර ලක්ෂණ ද පවතී. පහත ඒවා අතරින් වෙළඳපොළ ආර්ථිකයක මූලික ලක්ෂණයක් වන්නේ,

a) පිරිවැය අවම කිරීමටත් නව්‍යතා හඳුන්වා දීමටත් පෙළඹීම.
b) ඇතැම් විට සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වීම.
c) සම්පත් බෙදා හැරීමේදී මිල සැලකිල්ලට ගැනීම.
d) පොදු යහපත මත කටයුතු කිරීම.
e) බාහිරතා සැලකිල්ලට ගැනීම සහ ආදායම් බෙදී යාමේ විෂමතා පැවතීම.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

6) ව්‍යාපාරික අයභාරය ඉහල නංවා ගැනීමේ අරමුණෙන් X හා Y භාණ්ඩවල සැපයුම වැඩි කිරීමට තීරණය කරන ලදී.එහි ප්‍රතිපලයක් ලෙස X භාණ්ඩයේ අලෙවියෙන් ලැබෙන අයභාරය ඉහළ ගිය ද Y භාණ්ඩය අලෙවියෙන් ලැබෙන අයභාරය පහළ ගියේ ය.මෙයට හේතුව වනුයේ,

a) X භාණ්ඩයේ ඉල්ලුම් මිල නම්‍ය වීම හා Y භාණ්ඩයේ ඉල්ලුම් මිල අනම්‍ය වීම වේ.
b) X භාණ්ඩයේ සැපයුම් මිල අනම්‍ය වීම හා Y භාණ්ඩයේ ඉල්ලුම් මිල අනම්‍ය වීම වේ.
c) X භාණ්ඩයේ ඉල්ලුම් මිල අනම්‍ය වීම හා Y භාණ්ඩයේ ඉල්ලුම් මිල නම්‍ය වීම වේ.
d) X භාණ්ඩයේ සැපයුම් මිල අනම්‍ය වීම හා Y භාණ්ඩයේ සැපයුම් මිල නම්‍ය වීම වේ.
e) X භාණ්ඩයේ සැපයුම් මිල නම්‍ය වීම හා Y භාණ්ඩයේ සැපයුම් මිල අනම්‍ය වීම වේ.

7) A භාණ්ඩයේ මිලෙහි වෙනසට අනුව ගණනය කරන ලද B භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාව 0.5 වූ අතර C භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාව 0.7 කි.භාණ්ඩ වර්ග සම්බන්දව ගත හැකි නිවැරදි නිගමනය වන්නේ,

a) A භාණ්ඩයේ ඉල්ලුම් මිල නම්‍ය වන අතර B භාණ්ඩයේ ඉල්ලුම් මිල අනම්‍ය වේ.
b) A භාණ්ඩය සපයන ආයතනයට B භාණ්ඩය සපයන ආයතනයට වඩා වෙළෙඳපොළ බලයක් පවතී
c) B භාණ්ඩය අත්‍යාවශ්‍ය භාණ්ඩයක් වන අතර C භාණ්ඩය සුඛෝපභෝගී භාණ්ඩයකි
d) B භාණ්ඩය සපයන ආයතනයට C භාණ්ඩය සපයන ආයතනයට වඩා වෙළෙඳපොළ බලයක් පවතී
e) B හා C භාණ්ඩ දෙවර්ගයේම ඉල්ලුම් මිල අනම්‍ය වේ

8) එක්තරා භාණ්ඩයක මිල රුපියල් 25ක් වන විට ඉල්ලුම් ප්‍රමාණය ඒකක 300ක් විය. මිල ඉල්ලුම් නම්‍යතාවය 3ක් වන මෙම භාණ්ඩයෙහි ඉල්ලුම් ප්‍රමාණය ඒකක 480ක් වන්නේ කවර මිලකදීද?

a) රුපියල් 12.50
b) රුපියල් 15.00
c) රුපියල් 20.00
d) රුපියල් 30.00
e) රුපියල් 25.00

9) පහතට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයකට ආයතනය මුහුණ දී සිටි. මිල ඉල්ලුම් නම්‍යතාවය 1 ක් වන අවස්ථාවේදී ආයතනය නිෂ්පාදන කටයුතු සිදු කරයි නම්,

a) මිල අඩු කළොත් අය භාරය වැඩි වේ.
b) මිල වැඩි කළහොත් අය භාරය වැඩි වේ.
c) ඉල්ලුම් ප්‍රමාණය වැඩි වුවහොත් අයභාරය වැඩි වේ.
d) මිල වෙනස් කළහොත් අය භාරය අඩුවේ.
e) ඉල්ලුම් ප්‍රමාණය අඩු වුවහොත් අය භාරය අඩුවේ.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

10) තරගකාරී වෙළඳපොලක අලෙවි වන එක්තරා භාණ්ඩයක මිල රුපියල් 2කේදී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 400කි. මිල රුපියල් 2ක බැගින් වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය ඒකක 80 බැගින් අඩුවේ. ඉල්ලුම් නම්‍යතාවය 1 ට සමාන වන්නේ කවර මිලකදීද?

a) රුපියල් 4 දී
b) රුපියල් 6 දී
c) රුපියල් 5 දී
d) රුපියල් 8 දී
e) රුපියල් 2 දී

11) Qd = -10P + 200 වන වෙළඳපොළක ඉල්ලුම් වක්‍රයක් සහිත භාණ්ඩයක සමතුලිත මිල රුපියල් 15 දී

| ඉල්ලුම් නම්‍යතාවය | පාරිභෝගික අතිරික්තය |
|---|---|
| a) -1.0 | 50 |
| b) -3.0 | 125 |
| c) -2.0 | 150 |
| d) -3.0 | 120 |
| e) -1.5 | 50 |

12) පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතින භාණ්ඩයක් මත විශේෂිත බද්දක් පැන වීම නිසා බිහි විය නොහැක්කේ මින් කුමක්ද?

a) භාණ්ඩයේ මිල බද්දේ ප්‍රමානයෙන් ම ඉහල යාම.
b) ආර්ථික අතිරික්තය නොවෙනස් ව පැවතීම.
c) රජයට කලින් ඇස්තමේන්තු කළ ප්‍රමාණයේම බදු අයභාරයක් උපයාගත හැකි වීම.
d) අධි බදු බරක් හෙවත් පරිවාරක පිරිවැයක් හට නොගැනීම.
e) සැපයුම් වක්‍රය බද්දේ ප්‍රමාණයෙන්ම වමට විතැන් වීම.

13) ඉල්ලුම් ශ්‍රිතයහි නම්‍යතාවය සෑම ලක්ෂයකදීම 1 ට වඩා අඩුවේ. සැපයුම් ශ්‍රිතය Qs = -100 + 5p ක් පවතින වෙළඳපොළක් මත සහනාධාර පනවනු ලැබුවහොත්,

a) සහනාධාර වාසියෙන් වැඩි කොටසක් ගැනුම්කරුවෝ ලබති.
b) සහනාධාර වාසිය මුළුමනින්ම ගැනුම්කරුවෝ ලබති.
c) සහනාධාර වාසියෙන් වැඩි කොටසක් අලෙවිකරුවෝ ලබති.
d) ගැනුම්කරුවෝ සහ අලෙවිකරුවෝ සමානව සහනාධාර වාසිය ලබති.
e) වාසිය දෙපිරිස අතර බෙදී යන ආකාරය තීරණය කළ නොහැක.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

14) තරගකාරී වෙළඳපොළක එක්තරා භාණ්ඩයක සමතුලිත මිල ඒකකයක් රුපියල් 20 ක් බව සලකන්න. දැන් මෙම වෙළඳපොළෙහි මිල රජය මැදිහත්ව දැන් පවතින සමතුලිත මිල මෙන් දෙගුණයක් ලෙස අවම මිලක් පනවනු ලබයි. වෙළඳපොළෙහි එක ගැනුම්කරුවකුගේ ඉල්ලුම් ශ්‍රිතය QD = 300 – 6P නම් අවම මිල එම ගැනුම්කරුවාගේ පාරිභෝගික අතිරික්තයට කරනු ලබන බලපෑම කුමක්ද?

a) රුපියල් 300කින් වැඩිවේ.
b) රුපියල් 300කින් අඩුවේ.
c) රුපියල් 2,400කින් වැඩිවේ.
d) රුපියල් 2,400කින් අඩුවේ.
e) රුපියල් 2,700කින් අඩුවේ.

15) රජය විසින් විකුණුම්කරුවන් මත ලබා දී තිබූ ඒකක සහනාධාරයක් ඉවත් කරන අවස්ථාවක් පහත රූප සටහනේ දැක්වේ.






www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub

සහනාධාර ඉවත් කිරීම හේතුවෙන්,

| පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදන අතිරික්තය | සමාජ සුභසාධනය |
|---|---|---|
| a)bc ප්‍රමාණයෙන් අඩුවේ | efg ප්‍රමාණයෙන් අඩුවේ | d ප්‍රමාණයෙන් අඩුවේ. |
| b)bc ප්‍රමාණයෙන් අඩුවේ | efg ප්‍රමාණයෙන් අඩුවේ | d ප්‍රමාණයෙන් ඉහළ යයි. |
| c)efg ප්‍රමාණයෙන් අඩුවේ | bc ප්‍රමාණයෙන් අඩුවේ | d ප්‍රමාණයෙන් ඉහළ යයි. |
| d)efg ප්‍රමාණයෙන් ඉහළ යයි | bc ප්‍රමාණයෙන් ඉහළ යයි | d ප්‍රමාණයෙන් අහිමි වේ |
| e)efg ප්‍රමාණයෙන් පහළ යයි | bc ප්‍රමාණයෙන් ඉහළ යයි | d ප්‍රමාණයෙන් අහිමි වේ |

16) පරිමාණානුකූල පිරිමැසුම්

a. හැමවිටම නිශ්ප්‍රාමාණික ලාභ වැඩි වීමට හේතු වේ
b. සාමාන්‍ය පිරිවැය වැඩි වීමට හේතු වේ
c. බහු ජාතික සමාගම්වලට ප්‍රතිලාභ ගෙන දීමට හේතු වේ
d. නිමවුමේ සමානුපාතික වැඩි වීමට හේතු වේ
e. දිගු කාලීන සාමාන්‍ය පිරිවැය පහළ වැටීමට හේතු වේ

17) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ නිමවුම ශුන්‍ය වන විට මුළු පිරිවැය රුපියල් 360 ක් වේ. ඒකක 4 ක් නිපදවීමේදී මුළු පිරිවැය රුපියල් 560 ක් වේ නම්, එම නිමැවුම මට්ටමේදී සාමාන්‍ය විචල්‍ය පිරිවැය වනුයේ,

a. රුපියල් 90.00
b. රුපියල්140.00
c. රුපියල් 50.00
d. රුපියල් 200.00
e. රුපියල් 40.00

18) නිෂ්පාදන සාධකයක වර්තමාන භාවිතයේ ආවස්ථික පිරිවැයට සමාන වන්නේ,

a) ආර්ථික බදුකුලියට
b) ප්‍රමාණික ලාභයට
c) ආර්ථික ලාභයට
d) අවම සාමාන්‍ය පිරිවැයට
e) සංක්‍රාම ඉපයීමට


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

19) කෙටි කාලයේදී X භාණ්ඩය නිෂ්පාදනය කරන විට හටගන්නා ආන්තික පිරිවැය පහත දැක්වේ.

| නිමැවුම (ඒකක) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|
| ආන්තික පිරිවැය | 30 | 20 | 16 | 24 | 40 | 56 | 64 |

මුළු ස්ථාවර පිරිවැය රුපියල් 30 නම් කෙටි කාලයකදී සාමාන්‍ය මුළු පිරිවැය අවම වන්නේ කවර නිමැවුම් ප්‍රමාණයකද?

a) නිමැවුම් ඒකක 2 දී
b) නිමැවුම් ඒකක 4 දී
c) නිමැවුම් ඒකක 3 දී
d) නිමැවුම් ඒකක 5 දී
e) නිමැවුම් ඒකක 6 දී

20) පූර්ණ තරගකාරී ආයතනයක් දිගු කාලයේදී ප්‍රාමාණික ලාභ ඉපැයීමට මූලික හේතුව කුමක්ද?

a) මිල ආන්තික පිරිවැයට සමාන වීමයි.
b) ආයතනික පැවරුණු මිලක් යටතේ කටයුතු කිරීමයි.
c) සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය කිරීමයි.
d) ඉල්ලුම් වක්‍රය සිරස් රේඛාවක් වීමයි.
e) බාධාවකින් තොරව වෙළඳපොළට ඇතුළු වීමට හා ඉවත් වීමට හැකි වීමයි.

21) එක්තරා ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත පහත දැක්වේ.( රු.බිලියන)

| | |
|---|---|
| පුද්ගලික පරිභෝජනය | 2,600 |
| දළ ආයෝජන | 600 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් | 400 |
| වැටුප් | 2,000 |
| ශුද්ධ අපනයන | -150 |
| ක්ෂය වීම් | 250 |

මෙහි ලබා දී ඇති දත්ත අනුව වියදම් ක්‍රමය (Expenditure Approach) භාවිතයෙන් දළ දේශීය නිෂ්පාදනය(GDP) ගණනය කරන්න.

a) රු.බිලියන 3,450
b) රු.බිලියන 3,350
c) රු.බිලියන 3,050
d) රු.බිලියන 5,000
e) රු.බිලියන 3,200

22) යම් කාලපරිච්ඡේදයක් තුළ නේවාසික ආර්ථික ඒකක එකතු කළ අගයේ වටිනාකම හැඳින්වෙන්නේ,

a) මූලික මිලට එකතු කළ අගය.
b) ගැනුම්කරුවන්ගේ මිලට දළ දේශීය නිෂ්පාදිතය.
c) දේශීය නිෂ්පාදිතය.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

d) නිෂ්පාදිතයන්ගේ මිලට මුළු එකතු කළ අගය.
e) රජය සහ පුද්ගලික අංශය එක්ව සම්පත් හිමිකාරිත්වය දරන ආර්ථික ක්‍රමය.

23) කමිස නිෂ්පාදකයෙක් රුපියල් 1,000 ක් වටිනා රෙදි සහ රුපියල් 200 ක් වටිනා නූල් සහ බොත්තම් මිලට ගෙන ඒවායෙන් කමිස නිපදවා එම එක් කමිසයක් රුපියල් 2,000 බැගින් පාරිභෝගිකයට අලෙවි කරයි. දළ දේශීය නිෂ්පාදනය සඳහා කමිස නිෂ්පාදකයාගේ දායකත්වය වන්නේ,

a) රුපියල් 3,200
b) රුපියල් 3,000
c) රුපියල් 2,200
d) රුපියල් 800
e) රුපියල් 2,000

24) පහත රේඛීය පරිභෝජන ශ්‍රිතයක් දැක්වේ. මෙම පරිභෝජිත ශ්‍රිතයෙහි ස්වායක්ත පරිභෝජන වියදම රුපියල් 4,000ක් වේ නම්, B ලක්ෂයේදී මුළු පරිභෝජන වියදම කොපමණද?




a) රුපියල් 18,000
b) රුපියල් 17,000
c) රුපියල් 16,000
d) රුපියල් 14,000
e) රුපියල් 10,000




iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

25) එක්තරා ආර්ථිකයක වැය කළ හැකි ආදායම රුපියල් 1,000 සිට රුපියල් 1,500 දක්වා ඉහළ යාමේදී පරිභෝජනය රුපියල් 1,000 සිට රුපියල් 1,400 දක්වා ඉහළ ගියේ නම්, එම ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය කුමක්ද?

a) C = 300 + 0.8 yd
b) C = 200 + 0.5 yd
c) C = 400 + 0.8 yd
d) C = 200 + 0.7 yd
e) C = 200 + 0.8 yd

26) පුද්ගලයකු තම ඉතුරුම් තැන්පතුවෙන් රුපියල් මිලියනයක් ලබාගෙන එය තම ජංගම ගිණුමේ තැන්පත් කළහොත් එය M1 සහ M2 මුදල් සැපයුමට බලපාන්නේ කෙසේද?

a) M1 මුදල් සැපයුම හා M2 මුදල් සැපයුම වෙනස් නොවේ.
b) M1 මුදල් සැපයුම වැඩිවේ. M2 මුදල් සැපයුම වෙනස් නොවේ.
c) M1 මුදල් සැපයුම වෙනස් නොවේ. M2 මුදල් සැපයුම වැඩිවේ.
d) M1 මුදල් සැපයුම අඩුවේ. M2 මුදල් සැපයුම වැඩිවේ.
e) M1 මුදල් සැපයුම වැඩිවේ. M2 මුදල් සැපයුම වැඩිවේ.

27) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විවට වෙළඳපොළ මිලදී ගැනීම් සිදුකරන විට,

a) වාණිජ බැංකු අධිසංචිත පහළ යන අතර ණය ප්‍රසාරණය කිරීමේ හැකියාව අඩුවේ.
b) අධි බලැති මුදල් ඉහළ යන අතර වාණිජ බැංකු වලට ණය ප්‍රසාරණය කිරීමේ හැකියාව වැඩිවේ.
c) වාණිජ බැංකු අධිසංචිත පහළ යන අතර අධි බලැති මුදල් පහළ යයි.
d) වාණිජ බැංකු අධිසංචිත ඉහළ යන අතර අධිබලැති මුදල් නොවෙනස්ව පවතී.
e) වාණිජ බැංකු වලට ණය ප්‍රසාරණය කිරීමේ හැකියාව වැඩිවන අතර අධිබලැති මුදල් නොවෙනස්ව පවතී.

28) උද්ධමනීය පරතරයක් පියවීමට යෝග්‍යතම ප්‍රතිපත්තිය වන්නේ,

a) සංචිත අවශ්‍යතා පහළ හෙළීම සහ හිඟ අයවැය ලේඛනයක් ක්‍රියාවට නැංවීම.
b) සංචිත අවශ්‍යතා ඉහල නැංවීම සහ වට්ටම් අනුපාතික පහළ හෙළීම.
c) මුදල් සැපයුම වැඩි කිරීම, රජයේ වියදම් සහ බදු අඩු කිරීම.
d) මුදල් සැපයුම අඩු කිරීම, රජයේ වියදම් සහ බදු අඩු කිරීම.
e) සංචිත අවශ්‍යතා ඉහල නැංවීම, රජයේ වියදම් අඩු කිරීම සහ බදු වැඩි කිරීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

29) ඒකාධිකාරී බැංකු පද්ධතියක් තනි වාණිජ බැංකුවකින් සමන්විත වන අතර ගනුදෙනුකරුවෙකු මෙම බැංකුවේ රුපියල් 200,000 තැන්පත් කර ඇත. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් නම්, මෙම තැන්පතුව නිසා ලබා දිය හැකි උපරිම ණය මුදලේ වටිනාකම කොපමණද?

a) රුපියල් 200,000
b) රුපියල් 18,000
c) රුපියල් 20,000
d) රුපියල් 180,000
e) රුපියල් 20,000

30) වාණිජ බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවක් සතුව රුපියල් මිලියන 400ක සංචිත සහ රුපියල් මිලියන 3,500ක බැංකු තැන්පතු පවතී. මෙම බැංකුවේ ගනුදෙනුකරුවෙකු රුපියල් මිලියන 100 ක් අලුතෙන් තැන්පත් කරයි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%ක් නම් දැන් බැංකු සතු අධිසංචිත ප්‍රමාණය කොපමණද?

a) රුපියල් මිලියන 380
b) රුපියල් මිලියන 240
c) රුපියල් මිලියන 140
d) රුපියල් මිලියන 450
e) රුපියල් මිලියන 60

31) ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීම අනාරක්ෂිත යැයි මහජනතාව තුළ පවතින මතය ඉහළ යාමක්,

a) වාණිජ බැංකුවල තැන්පතු පහළ යාමට බලපායි.
b) වාණිජ බැංකුවල තැන්පතු වලට බලපෑමක් ඇති නොකරයි.
c) වාණිජ බැංකුවල තැන්පතු ඉහළ යාමට බලපාන අතර වාණිජ බැංකුවල ණය ප්‍රසාරණ හැකියාව ඉහළ දමයි
d) වාණිජ බැංකුවල රජයේ ප්‍රසාරණ හැකියාව සඳහා කිසිදු බලපෑමක් ඇති නොකරයි.
e) ආර්ථිකයේ මුදල් සැපයුම පහළ යාමට බලපායි.

32) අර්ධ පොදු භාණ්ඩ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

a) සාමූහිකව පරිභෝජනය කළ හැකි භාණ්ඩයක් වන අතර පරිභෝජනය සීමා කළ හැකිය.
b) මෙම භාණ්ඩ සඳහා කිසිදු විටෙක මිලක් අය කළ නොහැකිය.
c) ධාරිතා මට්ටම තෙක් පරිභෝජනයෙන් තරගකාරීත්වයක් නොමැති පරිභෝජන සීමා කළ හැකි භාණ්ඩයෙකි.
d) පරිභෝජනය සීමා කර නොහැකි පරිභෝජනය තරගකාරීත්වයක් නොපවතින භාණ්ඩයකි.
e) සෑම විටම සෘණ බාහිරතා ගෙන දෙන භාණ්ඩයෙකි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

33) ආණ්ඩුව අසමත් වීම් සෑම විටම හට ගනුයේ,

a) භාණ්ඩ හා සේවා කාර්යක්ෂමව බෙදා වෙන් කිරීමට මිල ක්‍රමය අපොහොසත් වන විටය.
b) වෙළඳපොළෙහි බාහිරතා දක්නට ලැබෙන බැවිනි.
c) වෙළඳපොළ මගින් පොදු භාණ්ඩ හා සේවා නොසපයන විටය.
d) වෙළඳපොළ අසමත් වීම් ඉවත් කිරීමට ආණ්ඩුව අපොහොසත් වන විටය.
e) වෙළඳපොළෙහි සමාජ පිරිවැය සමාජ ප්‍රතිලාභ වලට වඩා විශාල වන විටය.

34) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බදු වර්ග අතුරින් අනුක්‍රමික, ප්‍රතික්‍රමික සහ සමානුපාතික බදු සඳහා නිවැරදි පිළිතුර කුමක්ද?

| | අනුක්‍රමික බද්ද | ප්‍රතික්‍රමික බද්ද | සමානුපාතික බද්ද |
|---|---|---|---|
| a) | පුද්ගල ආදායම් බද්ද මත බද්ද | සුරා බද්ද | එකතු කළ අගය |
| b) | පුද්ගල ආදායම් බද්ද | එකතු කළ අගය මත බද්ද | සුරා බද්ද |
| c) | නිෂ්පාදිත බද්ද මත බද්ද | පුද්ගල ආදායම් බද්ද | එකතු කළ අගය |
| d) | එකතු කළ අගය මත බද්ද | වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද | විදුලි සංදේශ බද්ද |
| e) | නිෂ්පාදිත බද්ද | එකතු කළ අගය මත බද්ද | පුද්ගල ආදායම් බද්ද |

35) නිදහස් තරගකාරී වෙළඳපොළක නිෂ්පාදනය කෙරෙන එක්තරා භාණ්ඩයක සමතුලිත නිමැවුම් මට්ටමේදී එහි ආන්තික පෞද්ගලික හා බාහිර ප්‍රතිලාභත් ආන්තික පෞද්ගලික හා බාහිර පිරිවැයත් වගුවෙහි දැක්වේ.

| | රුපියල් මිලියන | | රුපියල් මිලියන |
|---|---|---|---|
| පෞද්ගලික ප්‍රතිලාභ | 30 | ආන්තික පෞද්ගලික පිරිවැය | 10 |
| බාහිර ප්‍රතිලාභ | 20 | ආන්තික බාහිර පිරිවැය | 0 |

මෙම වෙළඳපොළට රජය මැදිහත් වීමෙන් සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවිය හැකිය. මක් නිසාද යත් එම භාණ්ඩය,

a) පොදු භාණ්ඩයක් බැවිනි
b) අවශ්‍ය භාණ්ඩයක් බැවිනි
c) ශුභ සාධක භාණ්ඩයක් බැවිනි
d) ගෝලීය පොදු භාණ්ඩයක් බැවිනි
e) බාල භාණ්ඩයක් බැවිනි


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

36) ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ශ්‍රම ඒකකයක් තුළින් නිපදවිය හැකි මෝටර් රථ සහ බයිසිකල් ඒකක සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

| | මෝටර් රථ | බයිසිකල් |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 20 | 10 |
| ඉන්දියාව | 15 | 45 |

රටවල් දෙක අතර වාසිදායක වෙළඳ අනුපාතය වන්නේ,

a) කාර් ඒකකයට බයිසිකල් ඒකක 0.5ත් 3ත් අතර ප්‍රමාණයක්
b) බයිසිකල් ඒකකයකට කාර් ඒකක 0.22ත් 4.5ත් අතර ප්‍රමාණයක්
c) කාර් ඒකකයකට බයිසිකල් ඒකක 0.75ත් 1.33ත් අතර ප්‍රමාණයක්
d) බයිසිකල් ඒකකයකට කාර් ඒකක 0.5ත් 3ත් අතර ප්‍රමාණයක්
e) කාර් ඒකකයකට බයිසිකල් ඒකක 0.33ත් 2ත් අතර ප්‍රමාණයක්

37) රටක භාණ්ඩ වෙළඳ අනුපාතය එහි පැවති අගය 100 සිට 120 දක්වා ඉහළ ගොස් ඇත. මෙම වෙනස්වීම සඳහා අපනයන මිල දර්ශකයෙහි සහ ආනයන මිල දර්ශකයෙහි කවර වෙනස්කම් සිදු විය යුතුද?

| | අපනයන මිල දර්ශකය | ආනයන මිල දර්ශකය |
|---|---|---|
| a) | +20% | -20% |
| b) | +20% | +20% |
| c) | -20% | 0% |
| d) | +40% | +50% |
| e) | -40% | -50% |

38) සඵල ආරක්ෂක අනුපාතය ඉහළ යාමට බලපාන සාධකයක් වන්නේ,

a) අවසාන නිෂ්පාදිතය මත පනවනු ලබන තීරු බදු අනුපාතිකය ඉහළ අගයක් ගැනීම.
b) ආනයනික යෙදවුම් මත පණුවනු ලබන තීරු බදු අනුපාතය ඉහළ අගයක් ගැනීම.
c) භාණ්ඩයේ වටිනාකම තුළ ඇතුලත් ආයතනික යෙදවුම් ඉහළ අගයක් ගැනීම.
d) අවසාන නිෂ්පාදිතය මත පනවනු ලබන තීරු බදු අනුපාතිකය පහළ අගයක් ගැනීම.
e) අපනයන භාණ්ඩ මත පනවනු ලබන සහනාධාර ඉහළ අගයක් ගැනීම.

39) ආරක්ෂක වාදයට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්කයක් වන්නේ,

a) නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගත හැකිවීම.
b) වෙළඳ ප්‍රපාතය වළක්වා ගත හැකිවීම.
c) ගෙවුම් ශේෂ දුෂ්කරතා ඇතිවීම.
d) විදේශ වෙළඳාම සංකෝචනය වීම නිසා ජාතික ආදායම සංකෝචනය වීම.
e) දියුණු තාක්ෂණය සංක්‍රමණය වීම සීමා වීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

40) අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී දේශීය මුදල් ඒකකයේ බාහිර අගය අඩුවීමක්,

a) අපනයනය කරනු ලබන භාණ්ඩවල විදේශ මිල ඉහළ නංවයි.
b) ආනයනය කරනු ලබන භාණ්ඩ වල දේශීය මිල පහල නංවයි.
c) එම රටට විදේශීය සංචාරකයන් පැමිණීම සීමා කරයි.
d) එම රටට විදේශීය සංචාරකයන් පැමිණීම ධෛර්යමත් කරයි.
e) ආනයනය කරනු ලබන භාණ්ඩ වල විදේශ මිල ඉහළ නංවයි.

41) කිසියම් රටක ගෙවුම් ශේෂ ලේඛණයට අදාළ දත්ත පහත දැක්වේ. (සංඛ්‍යා රුපියල් බිලියන වලිනි)

| | |
|---|---|
| භාණ්ඩ අපනයන | 100 |
| භාණ්ඩ ආනයන | 150 |
| සේවා ගිණුමේ අතිරික්තය | 75 |
| විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම | 125 |
| විදේශ සංචිත ආයෝජන | 25 |
| ශුද්ධ ප්‍රාග්ධන සංක්‍රාම | 65 |
| විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම් | 150 |
| විදේශ ශුද්ධ පෞද්ගලික වර්තන සංක්‍රාම | 225 |

වර්තන ගිණුමේ ශේෂය කොපමණද?

a) රුපියල් බිලියන 315
b) රුපියල් බිලියන 225
c) රුපියල් බිලියන 290
d) රුපියල් බිලියන 250
e) රුපියල් බිලියන 465

42) විදේශ රටකින් ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ගයක් ඉදිකිරීම සඳහා ලැබුණු ව්‍යාපෘති දීමනාවක් ගෙවුම් ශේෂ ලේඛනයේ වාර්තා කරනු ලබන නිවැරදි ද්විත්ව සටහන කුමක්ද?

a) මූල්‍ය ගිණුම හර, වෙළඳ ගිණුම බැර
b) මූල්‍ය ගිණුම හර, ප්‍රාථමික ආදායම් ගිණුම බැර
c) මූල්‍ය ගිණුම හර, ප්‍රාග්ධන ගිණුම බැර
d) වෙළඳ ගිණුම හර, මූල්‍ය ගිණුම බැර
e) ප්‍රාග්ධන ගිණුම හර, මූල්‍ය ගිණුම බැර

43) ශ්‍රී ලංකාව වෙත සංචාරක ඉපයීම් ඉහළ යන විට බොහෝ සෙයින් සිදුවිය හැක්කේ,

a) දේශීය විනිමය ඉල්ලුම ඉහළ යන අතර විනිමය අනුපාතයේ අගය ඉහළ යාමක් වාර්තා කරයි.
b) දේශීය විනිමය සැපයුම ඉහළ යන අතර විනිමය අනුපාතයේ අගය ඉහළ යාමක් වාර්තා කරයි.


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

c) විදේශ විනිමය ඉල්ලුම ඉහළ යන අතර විනිමය අනුපාත අවප්‍රමාණය වීමක් සිදු වේ.
d) විදේශ විනිමය සැපයුම ඉහළ යන අතර විනිමය අනුපාත අවප්‍රමාණ වීමක් සිදුවේ.
e) දේශීය විනිමය සැපයුම ඉහළ යන අතර විනිමය අනුපාත ක්ෂය වීමක් වාර්තා කරයි.

44) දේශීයව නිෂ්පාදනය කරන සපත්තු ජෝඩුවක මිල රුපියල් 2,500ක් වන අතර ඒ සඳහා රුපියල් 1,000 ආනයනික යෙදවුම් භාවිතා කරයි. ඒ හා සමාන සපත්තු ජෝඩුවක් විදේශ රටකින් එම මිලට ආනයනය කරන අතර රජය දේශීය නිෂ්පාදකයා රැකගැනීමේ අරමුණින් ආනයනික සපත්තු මත 20%ක තීරු බදු සහ යෙදවුම් මත 10%ක තීරු බදු පැන වූයේ නම් සඵල ආරක්ෂක අනුපාතය වන්නේ,

a) 33.33%
b) 20%
c) 30%
d) 10%
e) 26.66%

45) මානව සංවර්ධනය යනුවෙන් හැඳින්වෙන්නේ,

a) කිසියම් රටක භාණ්ඩ හා සේවා තොගයේ සිදුවන ප්‍රමාණාත්මක වැඩිවීමකි.
b) රටක නිෂ්පාදන ධාරිතාවේ සිදුවන ඉහළ යාමකි.
c) මිනිසාට තම මානව හැකියාවන් වර්ධනය කර ගැනීමටත් එම හැකියාවන් විවිධ ක්ෂේත්‍රවල භාවිතා කිරීමටත් ඉඩ ප්‍රස්ථා සැලසීමයි.
d) මිනිසාගේ ජීවිතය අයහපත් තත්ත්වයක සිට යහපත් තත්ත්වයකට මාරුවීමයි.
e) ව්‍යුහාත්මක වෙනස්කම් හා බැඳුණු ආර්ථික වෘද්ධි ක්‍රියාවලියයි.

46) මානව සංවර්ධක දර්ශකය මිනුම් කිරීමේදී ඇතුළත් කරනුයේ,

a) උපතේදී ආයු අපේක්ෂණය, ළමා මරණ අනුපාතිකය, වැඩිහිටි මරණ අනුපාතිකය
b) යැපුම් අනුපාතිකය, අධ්‍යාපනය, සාක්ෂරතාවය
c) උපතේදී ආයු අපේක්ෂණය, අධ්‍යාපනය, ක්‍රය ශක්ති සාම්‍ය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම
d) සෞඛ්‍ය, අධ්‍යාපනය, සැපයුම් අනුපාතිකය
e) යැපුම් අනුපාතිකය, සෞඛ්‍ය, අධ්‍යාපනය


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

47) A හා B ආර්ථිකයට අදාළ ලොරන්ස් වක්‍රය පහත රූප සටහනේ දැක්වේ.




A හා B ආර්ථික සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

a) B ආර්ථිකයට වඩා A ආර්ථිකයේ වඩා සාධාරණ වූ ආදායම් ව්‍යාප්තියක් දැකිය නොහැක.

b) B ආර්ථිකයට වඩා A ආර්ථිකයේ වඩා සාධාරණ වූ ආදායම් ව්‍යාප්තියක් දැකිය හැක.

c) A හා B ආර්ථිකවල ගති සංගුණක එකිනෙක සමාන වේ.

d) A ආර්ථිකයට වඩා B ආර්ථිකයේ ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය අඩුය.

e) B ආර්ථිකයට වඩා A ආර්ථිකයේ ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය වැඩිය.

48) සංවර්ධනය මිනුම් කරනු ලබන ආර්ථික දර්ශක හා සංයුක්ත දර්ශක කීපයක් පහත දැක්වේ. ඒවා නිවැරදිව වර්ග කර ඇත්තේ,

A - භෞතික ජීවන තත්ත්ව දර්ශකය

B - මානව සංවර්ධන දර්ශකය

C - ප්‍රතිශීර්ෂ ආදායම

D - මානව ප්‍රාග්ධන දර්ශකය

E - ආර්ථික වර්ධන අනුපාතය

| | ආර්ථික දර්ශක | සංයුක්ත දර්ශක |
|---|---|---|
| a) | A, B, C | D, E |
| b) | C, D | A, B, E |
| c) | B, C, E | A, D |
| d) | C, E | A, B, D |
| e) | C, D, E | A, B |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

49) අස්වැසුම සමාජ සුභසාධක වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබන්නන් කාණ්ඩගත කර ඇත. එම කාණ්ඩයට ඇතුළත් නොවන්නේ පහත කවරක්ද?

a) සංක්‍රාන්ති දුප්පතුන් කාණ්ඩය
b) අවදානම් කාණ්ඩය
c) අවදානයට ලක් වූ කාණ්ඩය
d) අන්ත දුප්පත් කාණ්ඩය
e) දුප්පත් කාණ්ඩය

50) ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතා ඉවත් කිරීම සඳහා වඩා යෝග්‍ය වන්නේ පහත කවරක්ද?

a) මහ බැංකුවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.
b) වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ හා ස්ථාවර මට්ටමකින් පවත්වාගෙන යාම.
c) ණය වියදම් තාර්කීකරණය කිරීම සහ සැමට සමානව බෙදී යාමට හැකි ලෙසින් සුභසාධක වියදම් ඉහළ දැමීමට කටයුතු කිරීම.
d) ණය ප්‍රතිව්‍යුහගත කිරීම, සාර්ථකව නිම කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිසංස්කරණය අඛණ්ඩව පවත්වාගෙන යාම.
e) පාලන දුර්වලතා සහ දූෂණ අවදානම් පිළිබඳ ගැටළු විසඳීම සඳහා හඳුනාගත් ක්‍රියාමාර්ග නිසි ලෙස ක්‍රියාවට නැංවීම.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය : ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
University of Sri Jayewardenepura ;Department of Business Economics

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
General Certificate of Education (Adv. Level) Examination
கல்விப் பொதுத் தராதப் பத்திர (உயர் தர)ப் பரீட்சை

ආර්ථික විද්‍යාව II
பொருளியல் II
Economics II

21 S I

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

උපදෙස්

- "අ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද, "ආ" උප කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
- කාලය පැය තුනකි.

## අ කොටස

01.

i. ආර්ථික වර්ධනය මගින් හිඟකම යන ගැටලුව විසඳා ගත හැකිය. මෙම ප්‍රකාශය හා එකඟවේද පැහැදිලි කරන්න.

(ලකුණු 4)

ii. භූමිය හා ස්වභාවික ප්‍රාග්ධනය අතර වෙනස හඳුනාගනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 4)

iii. ආර්ථික නොවන සම්පත් හා නොමිල භාණ්ඩ අතර වෙනස්කම් පැහැදිලි කර නොමිලේ ලැබෙන භාණ්ඩ සියල්ලක්ම නොමිල භාණ්ඩ නොවන්නේ ඇයිදැයි විමසන්න.

(ලකුණු 4)

iv. තාක්ෂණික දැනුම හා මානව ප්‍රාග්ධනය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 4)

v. වෙළෙඳපොළ මිල යාන්ත්‍රණය සම්පූර්ණයෙන්ම අක්‍රිය කර ඇති විධාන ආර්ථිකයක් තුළ, කා සඳහා නිෂ්පාදනය කරන්නේද, යන මූලික ආර්ථික ප්‍රශ්නය විසඳීමේදී පැනනගින ප්‍රායෝගික දුෂ්කරතා මොනවාද?

(ලකුණු 4)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

02

i. "එක්තරා භාණ්ඩයක මිල වැඩි වීමේදී එහි ඉල්ලුම් ප්‍රමාණය වැඩි වී ගොස් ඇත." මෙයට හේතු විය හැකි අවස්ථා මොනවා ද?

(ලකුණු 3)

ii. කල්පිත ආර්ථිකයක භාණ්ඩ වර්ග තුනක ඉල්ලුම් නම්‍යතාවයන් පහත පරිදි වේ. එම අගයන් ඇසුරින් භාණ්ඩ වර්ගීකරණය හඳුනාගන්න.

1) -2
2) 2
3) 0.5

(ලකුණු 3)

iii. "මිල අඩු වීමේදී සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණය ද ඉහළ යන්නේ ආදේශන ප්‍රතිවිපාකය සහ ආදායම් ප්‍රතිවිපාකය යන බලවේග ද්විත්වයම එකම දිශාවකට ක්‍රියාත්මක වන බැවිනි."

මෙම ප්‍රකාශය ගිෆන් භාණ්ඩයක් සඳහා අදාළ නොවන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

iv. පහත දැක්වෙන සරල රේඛීය ඉල්ලුම් වක්‍රය සහ මිල ඉල්ලුම් නම්‍යතාවය උපයෝගී කරගනිමින් 'x' ට අදාළ ප්‍රමාණය ගණනය කරන්න.

$$0.5 = \frac{\Delta Qd}{\Delta p} \; x \; \frac{p}{Qd}$$




(ලකුණු 4)

v. පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තයට පහත සඳහන් වෙනස්වීම් බලපාන ආකාරය පැහැදිලි කරන්න.

1. සැපයුම් වක්‍රය ස්ථාවරව තිබියදී ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වීම.
2. ඉල්ලුම් වක්‍රය ස්ථාවරව තිබියදී සැපයුම් වක්‍රය වමට විතැන් වීම.

(ලකුණු 4)


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

03.

i. එක්තරා ආර්ථිකයක ස්ථාවර ජල සැපයුමක් පෞද්ගලික අංශය විසින් සපයයි. රජය මඟින් ජල ගාස්තුව මත උපරිම මිලක් පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද?

(ලකුණු 4)

ii. වෙළෙඳපොළකට අවම මිලක් පැනවීම මගින් පාරිභෝගික අතිරික්තය සෑම විටම අඩු වන නමුත් ඉන් නිෂ්පාදක අතිරික්තය අනිවාර්යයෙන්ම ඉහළ යන්නේ යැයි කිව නොහැක්කේ ඇයි ? (ලකුණු 4)

iii. කැරට් වෙළඳපෙළේ ඉල්ලුම් සහ අධි ඉල්ලුම් සමීකරණය පහත දැක්වේ.

$$Qd = 800 - 4p$$

$$Ed = 1000 - 8p$$

රජය මෙම භාණ්ඩය සඳහා රු.10 ක ඒකක සහනාධාරයක් ලබා දීමට සැලසුම් කර සිටියි.

1. සහනාධාරයට පෙර සමතුලිත මිල සහ ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)
2. සහනාධාරය පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට බෙදී යන ප්‍රමාණයන් ගණනය කරන්න. (ලකුණු 2)
3. සහනාධාරය සඳහා රජයේ වියදම ගණනය කරන්න. (ලකුණු 2)
4. සහනාධාරය නිසා අහිමි වන සුබසාධනය ගණනය කරන්න. (ලකුණු 2)

iv. කෘෂිකාර්මික භාණ්ඩවල මිල උච්චාවචනයන් පාලනය කිරීම සඳහා රජය ස්වාරක්ෂක තොග සංකල්පය යොදා ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 4)

04.

i. ආයතනයක් කෙටි කාලයේ දී නිමවුම වැඩිකරන විට යම් සීමාවකින් පසුව ආන්තික පිරිවැය ඉහළ යන්නේ ඇයි?

(ලකුණු 4)

ii. පූර්ණ තරඟකාරී වෙළඳපොළක් ප්‍රචාරණයට යොමු නොවීමට බලපෑ හැකි හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 4)

iii. රජයක් විසින් පාරිභෝගිකයන්ට සහන සැලසීමේ සහ තරඟකාරීත්වය වැඩිකිරීමේ පරමාර්ථයෙන්, එරට විදුලි බලමණ්ඩලය කුඩා තරඟකාරී සමාගම් කිහිපයකට වෙන් කිරීමට තීරණය කරයි. මෙම තීරණය හේතුවෙන් අදාළ කර්මාන්තයේ සාමාන්‍ය පිරිවැයට (ATC) සහ


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

අවසානයේ පාරිභෝගිකයා ගෙවන මිලට සිදුවන බලපෑම 'පරිමාණානුකූල ඵල' සංකල්පය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 4)

iv. තේ වත්තක දෛනික වැටුපට තේ දළු නෙළන ශ්‍රමිකයෙකුගේ ආදායම තුළ ආර්ථික බදුකුලිය සහ සංක්‍රාම ඉපයීම සාපේක්ෂව කුමන ආකාරයෙන් පවතී ද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 4)

v. කතිපයාධිකාරී වෙළඳපොළක මිල දැඩියාවක් පවතින්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 4)

05.

i. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න සඳහන් කර හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 4)

a) වසරකට වඩා වැඩිකාලයක් විදේශයන්හි සංගීත ප්‍රසංග පවත්වන පුද්ගලයෙකු නේවාසිකයෙකු ලෙස හඳුන්වයි.

b) ප්‍රාථමික යෙදවුම්වල වටිනාකම සහ දළ එකතු කළ අගය යනු එකම සංකල්පයකි.

c) පුද්ගලයෙකු තමා සතු මෝටර් රථය විකුණා ලබන ආදායම නිෂ්පාදන ඉමට ඇතුළත් වෙයි.

d) නිෂ්පාදිතය මත ශුද්ධ බදු ගැණුම්කරුවන්ගේ මිල තුළ පමණක් ඇතුළත් වෙයි.

ii. පහත දැක්වෙන්නේ එක්තරා වර්ෂයක රටක ජාතික ගිණුම් ආශ්‍රිත සංඛ්‍යා දත්ත කිහිපයකි. සියලුම සංඛ්‍යා රුපියල් දහස් වලිනි.

| | රු "000" |
|---|---|
| පෞද්ගලික පාරිභෝජන වියදම | 670 |
| ශුද්ධ විදේශ වර්තන සංක්‍රාම | 250 |
| මිශ්‍ර ආදායම් | 80 |
| සෙසු ලෝකයෙන් ලද ශුද්ධ ප්‍රාථමික ආදායම | 110 |
| සේවක ආදායම් | 1370 |
| ස්ථාවර ප්‍රාග්ධන පරභෝජනය | 90 |
| බදු කුලී | 60 |
| ලාභාංශ | 80 |
| නිෂ්පාදනය මත ලබාදුන් වෙනත් සහනාධාර | 20 |
| නිෂ්පාදනය මත අයකළ වෙනත් බදු | 60 |
| භාණ්ඩ හා සේවාමත සහනාධාර | 200 |



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

| | |
|---|---|
| භාණ්ඩ හා සේවාමත අයකල බදු | 300 |
| රජයේ පුනරාවර්තන වියදම් | 400 |
| ආනයන මත ශුද්ධ බදු | 320 |

පහත දෑ ගණනය කරන්න.

1. මූලික මිලට සමස්ථ එකතු කළ අගය (ලකුණු 02)

2. දළ දේශීය නිෂ්පාදිතය (ලකුණු 02)

3.වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 02)

iii. රජය රුපියල් බිලියන 50 කින් ස්වායක්ත බදු අඩු කරන අතර ඒ හා සමාන ප්‍රමාණයකින් රාජ්‍ය පාරිභෝජනය වැඩි කිරීමට තීරණය කරන ලදී. මෙම වෙනස නිසා ආර්ථිකය මත ඇති වන ශුද්ධ බලපෑම කොපමණද?

(ලකුණු 4)

iv. කිසියම් කල්පිත ආර්ථිකයක් සඳහා සාර්ව ආර්ථික දත්ත පහත දැක්වේ. (සියලුම දත්ත රුපියල් බිලියන වලිනි).

පාරිභෝජනය (C) = 250 + 0.8yd

සංක්‍රාම (Tr) = 50

ස්වායක්ත බදු (Tx) = 40

ආයෝජනය (I) = 200

රාජ්‍ය මිලදී ගැනීම් (G) = 150

ශුද්ධ අපනයන (Nx) = -100

(අ) මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම කොපමණ ද? (ලකුණු 2)

(ආ) වැය කළ හැකි දළ ජාතික ආදායම හා සමාහාර ඉතුරුම් කොපමණ ද? (ලකුණු 2)

(ඇ) සමතුලිත ජාතික ආදායම රුපියල් බිලියන 2,500 ක් කරා ළඟා වීමට ආයෝජන කොපමණ ප්‍රමාණයකින් වැඩි කළ යුතු ද? (ලකුණු 2)



iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

## <u>ආ කොටස</u>

06.

i. පොලී අනුපාතිකය සහ මුදල් ඉල්ලුම අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතිනුයේ ඇයි? පැහැදිලි කරන්න.

(ලකුණු 6)

ii. මුදල් සැපයුමේ හටගන්නා සැබෑ ප්‍රසාරණය බැංකු තැන්පතු ප්‍රසාරණ සංගුණකයෙන් දැක්වෙන ප්‍රමාණයට වඩා වෙනස් වීමට බලපාන සාධක කවරේ ද?

(ලකුණු 4)

iii. කල්පිත ආර්ථිකයක පටු මුදල් සැපයුම රුපියල් බිලියන 3,500 ක් වන අතර මහජනයා සතු ව්‍යවහාර මුදල් තොගය රුපියල් බිලියන 1,000 කි. මෙම ආර්ථිකයේ බැංකු පද්ධතිය සතු සංචිත ප්‍රමාණය රුපියල් බිලියන 300 ක් වන අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% කි.

(අ) මෙම බැංකු පද්ධතිය උපරිම ණය මැවීමෙන් පසු ශේෂ පත්‍රය පිළියෙළ කරන්න.

(ලකුණු 3)

(ආ) උපරිම ණය මැවීමෙන් පසුව ආර්ථිකයේ පටු මුදල් සැපයුම කොපමණ ද?

(ලකුණු 1)

iv. ''ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ බලධාරියා ශ්‍රී ලංකා මහ බැංකුව වුවත් මුදල් සැපයීම තීරණය කිරීමේ දී මහ බැංකුවට පාලනය කළ නොහැකි සාධකද ක්‍රියාත්මක වේ.'' මෙහි සත්‍ය හෝ අසත්‍යතාව පැහැදිලි කරන්න.

(ලකුණු 6)

07.

i. ශුද්ධ පොදු භාණ්ඩයක් යනු කුමක් ද? ශුද්ධ පොදු භාණ්ඩ සැපයුම් කිරීම සම්බන්ධයෙන් වෙළඳපොළ අසමත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 4)

ii. අයවැය ලේඛනයේ ප්‍රාථමික ශේෂය යනු කුමක් ද? කිසියම් රටක ණය තිරසරභාවය පිළිබඳ මිණුමක් වශයෙන් අයවැය ලේඛනයේ ප්‍රාථමික ශේෂය යොදාගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 6)

iii. ණය තිරසරභාවය යනු කුමක් ද? ශ්‍රී ලංකාවේ ණය තිරසරභාවය කුමන මට්ටමක පවතී ද?

(ලකුණු 6)

iv. පහත දැක්වෙන්නේ එක්තරා ආර්ථිකයකට අදාළ රාජ්‍ය අයවැය ලේඛනයක සාරාංශ සටහනකි. එම දත්ත යොදාගෙන පහත ප්‍රශ්න පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

| | (රු.බිලියන) |
|---|---|
| බදු ආදායම | 1,500 |
| බදු නොවන ආදායම | 2,000 |
| වර්තන වියදම් | 1,900 |
| ප්‍රදාන (මුදල්) | 1,000 |
| ප්‍රාග්ධන හා ශුද්ධ ණයදීම් | 3,000 |
| වර්ථන වියදම තුළ ඇති පොළිය | 100 |

(වසර අග වන විට ගෙවීමට ඇති මුළු ණය 4,000 කි.)

1) වර්තන ගිණුමේ ශේෂය ? (ලකුණු 1)

2) සමස්ථ අයවැය ශේෂය ? (ලකුණු 1)

3) ප්‍රාථමික ගිණුමේ ශේෂය ? (ලකුණු 1)

4) දළ මූල්‍ය අවශ්‍යතාවය? (ලකුණු 1)

08.

i. කිසියම් රටකට නිරපේක්ෂ වාසි නොමැති තත්ත්වයක දී වුවද, සාපේක්ෂ වාසි තිබිය හැකියි. සංඛ්‍යාත්මක උදාහරණයක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 4)

ii. තරගකාරිත්ව වාසිය යනු කුමක් ද? තරගකාරිත්ව වාසි හට ගන්නා මූලාශ්‍ර කවරේ ද?

(ලකුණු 4)

iii. විදේශ විනිමය අනුපාත අව ප්‍රමාණය වීමක් වෙළඳ ගිණුමේ හිඟය අඩු කිරීමට දායක වන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න.

(ලකුණු 4)

iv. (අ) පහත ගණුදෙණු ගෙවුම් ශේෂ ලේඛනයට බලපෑම් කරන ආකාරය හර සහ බැර සටහන් යොදා ගෙන දක්වන්න.

1 ශ්‍රී ලංකාව වෙනත් රටකට රු. මිලියන 200 ක් වටිනා ඇඟලුම් අපනයනය කිරීම.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

2 ශ්‍රී ලංකාව මැදපෙරදිග රටකින් රු. මිලියන 400 ක බනිජ තෙල් නැවක් ආනයනය කිරීම.

3 ශ්‍රී ලංකා රජය විසින් ලබාගෙන ඇති විදේශ ණය සඳහා රු. මිලියන 250 ක පොලියක් ගෙවීම

(ලකුණු 3)

(ආ) කිසියම් රටක ආර්ථිකය සම්බන්ධයෙන් පහත තොරතුරු ඔබට සපයා ඇත. (ඇ.ඩො.බිලියන)

| | හර | බැර |
|---|---|---|
| වෙළඳ ගිණුම | 18,000 | 12,000 |
| සේවා ගිණුම | 1,500 | 3,000 |
| ප්‍රාථමික ආදායම් ගිණුම | 2,500 | 500 |
| ද්විතීය ආදායම් ගිණුම | 500 | 6,000 |
| ප්‍රාග්ධන ගිණුම | 100 | 50 |
| ශුද්ධ වැරදීම් හා අත්හැරීම් | 400 | 200 |

පහත දෑ ගණනය කරන්න.

1. ජංගම ගිණුමේ ශේෂය (ලකුණු 2)
2. ප්‍රාග්ධන ගිණුමේ ශේෂය (ලකුණු 2)
3. මූල්‍ය ගිණුමේ ශේෂය (ලකුණු 1)

09.

i. ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ අරමුණු අතර ගැටුම් ඇති වන්නේ කෙසේද?

(ලකුණු 6)

ii. ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමෙහිලා බහුමාන දරිද්‍රතාවය (Multidimensional Poverty) තුරන් කිරීම ආදායම් දරිද්‍රතාවය (Income Poverty) තුරන් කිරීමට වඩා වැදගත් වන්නේ ඇයි?

(ලකුණු 6)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

iii. "මෑත කාලීනව ශ්‍රී ලංකාවෙන් වාර්තා වන ශීඝ්‍ර ශ්‍රම සංක්‍රමණය (Labor Migration), රටේ ආර්ථිකය තුළ 'විදේශ ප්‍රේෂණ' (Remittances) වර්ධනයකට හේතු වුවද, එමගින් දේශීය ශ්‍රම වෙළෙඳපොළ තුළ 'ශ්‍රම හිඟයක්' සහ 'සමාජ පිරිවැයක්' (Social cost) නිර්මාණය වී ඇත".
මෙම ප්‍රකාශය ඇසුරින්, ශ්‍රම සංක්‍රමණය නිසා දේශීය ආර්ථිකයේ සිදුවන හානි දෙකක් පැහැදිලි කරන්න . (ලකුණු 4)

iv. ශ්‍රී ලංකාව වැනි රටක' සමාජ ආරක්ෂණ' (Social Protection) පද්ධතියක ඇති කාලීන වැදගත්කම දක්වා, පුළුල් සමාජ ආරක්ෂණ ජාලයක අන්තර්ගත වන ප්‍රධාන කුළුණු 04 නම් කරන්න . (ලකුණු 4)

10.

i. මැදපෙරදිග කලාප තුළ මෑතකදී උත්සන්න වූ ඉරාන - ඊශ්‍රායල ඇමෙරිකානු භූ දේශපාලනික අර්බුදය ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර හා බාහිර ස්ථායිතාවය මත එල්ල කර ඇති බලපෑම විශ්ලේෂණය කරන්න.

(ලකුණු 6)

ii. "තිරසර සංවර්ධන ඉලක්ක" (SDGs) ළඟා කරගැනීමේදී ආර්ථිකයට මුහුණ පෑමට සිදුවන අභියෝග 3ක් පැහැදිලි කරන්න.

(ලකුණු 6)

iii. ශ්‍රී ලංකාව වැනි රටක තිරසාර ආර්ථික වර්ධනයක් ළඟා කරගැනීම සඳහා 'හරිත මූල්‍යකරණයේ' (Green Financing) ඇති කාලීන වැදගත්කම විග්‍රහ කරන්න .

(ලකුණු 4)

iv. මෑතකාලීනව වර්ධනය වන 'එල් නිනෝ' (El Niño) වැනි දරුණු දේශගුණික විපර්යාස හේතුවෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය හා ආහාර සුරක්ෂිතතාව කෙරෙහි ඇති කළ හැකි බලපෑම් පැහැදිලි කරන්න. (ලකුණු 4)

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය : ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
University of Sri Jayewardenepura ;Department of Business Economics

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය
General Certificate of Education (Adv. Level) Examination
கல்விப் பொதுத் தராதப் பத்திர (உயர் தர)ப் பரீட்சை

ආර්ථික විද්‍යාව I
பொருளியல் I
Economics I

21 S I

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

උපදෙස්

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (i), (ii), (iii), (iv), (v) යන පිළිතුරු අතරින් නිවැරදි හෝ ඉතා ආසන්න පිළිතුර තෝරන්න.
- කාලය පැය දෙකකි.

1) සූක්ෂම ආර්ථික විද්‍යාවට අයත් යථානුරූපී ප්‍රකාශය වන්නේ,

a) දරිද්‍රතාවය පිටුදැකීම සඳහා යෝග්‍යම ක්‍රමය දිළින්දන්ට සංක්‍රාම ලබාදීමයි.
b) රාජ්‍ය ව්‍යවසායකයන් කාර්යක්ෂම කිරීමට ඒවා පෞද්ගලීකරණය කිරීම යෝග්‍ය වේ.
c) ඕනෑම ආර්ථිකයක කේන්ද්‍රීය ආර්ථික ගැටලුව හිඟකමයි.
d) ආර්ථික වෘද්ධිය හා සේවා නියුක්තිය අතර අනුලෝම සම්බන්ධයක් පවතී.
e) ඉහළ මානව සංවර්ධන දර්ශකයක් සඳහා දිළිඳුකම තුරන් කළ යුතුය.

2) ආර්ථික නොවන සම්පත්වල ලක්ෂණයක් වන්නේ,

a) වුවමනාවන්ට සාපේක්ෂව සැපයුම සීමිත වේ.
b) මිලක් අය කළ හැකිවීම.
c) නිෂ්පාදන සාධක සඳහා වෙළඳපොළක් පැවතීම.
d) විකල්ප ප්‍රයෝජන ලබා ගත හැකිවීම.
e) හිඟකමක් හා ආවස්ථික පිරිවැයක් නොමැතිවීම.

3) X හා Y යන රටවල් දෙකට අදාළ නිෂ්පාදන හැකියා වක්‍ර පහත සඳහන් රූපසටහන පෙන්නුම් කරයි.






www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub

මෙම රටවල් දෙක සම්බන්දයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

a) රටවල් දෙකේම එක හා සමාන වූ ආවස්ථික පිරිවැයක් පවතී
b) රටවල් දෙකේම අනාගත වෘද්ධි අපේක්ෂා එක සමාන වේ
c) රටවල් දෙකේම ආවස්ථික පිරිවැය වැඩි වෙමින් පවතී
d) රටවල් දෙකේම එක හා සමාන වූ භාණ්ඩ කිසිවිටකත් නිපදවිය නොහැක.
e) ඇඟලුම් නිෂ්පාදනයේදී X රටේ ආවස්ථික පිරිවැය Y රටේ ආවස්ථික පිරිවැයට වඩා වැඩිය.

4) “දිට්වා” සුළි කුණාටුව නිසා බදුල්ල දිස්ත්‍රික්කයේ නිෂ්පාදන හැකියා වක්‍රයට වූ බලපෑම කුමක්ද?




Answer D

5) වෙළඳපොළ ආර්ථිකයක හිතකර ලක්ෂණ මෙන්ම අහිතකර ලක්ෂණ ද පවතී. පහත ඒවා අතරින් වෙළඳපොළ ආර්ථිකයක මූලික ලක්ෂණයක් වන්නේ,

a) පිරිවැය අවම කිරීමටත් නව්‍යතා හඳුන්වා දීමටත් පෙළඹීම.
b) ඇතැම් විට සම්පත් බෙදී යාම අකාර්යක්ෂම වීම.
c) සම්පත් බෙදා හැරීමේදී මිල සැලකිල්ලට ගැනීම.
d) පොදු යහපත මත කටයුතු කිරීම.
e) බාහිරතා සැලකිල්ලට ගැනීම සහ ආදායම් බෙදී යාමේ විෂමතා පැවතීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

6) ව්‍යාපාරික අයභාරය ඉහල නංවා ගැනීමේ අරමුණෙන් X හා Y භාණ්ඩවල සැපයුම වැඩි කිරීමට තීරණය කරන ලදී.එහි ප්‍රතිපලයක් ලෙස X භාණ්ඩයේ අලෙවියෙන් ලැබෙන අයභාරය ඉහළ ගිය ද Y භාණ්ඩය අලෙවියෙන් ලැබෙන අයභාරය පහළ ගියේ ය.මෙයට හේතුව වනුයේ,

a) X භාණ්ඩයේ ඉල්ලුම් මිල නම්‍ය වීම හා Y භාණ්ඩයේ ඉල්ලුම් මිල අනම්‍ය වීම වේ.
b) X භාණ්ඩයේ සැපයුම් මිල අනම්‍ය වීම හා Y භාණ්ඩයේ ඉල්ලුම් මිල අනම්‍ය වීම වේ.
c) X භාණ්ඩයේ ඉල්ලුම් මිල අනම්‍ය වීම හා Y භාණ්ඩයේ ඉල්ලුම් මිල නම්‍ය වීම වේ.
d) X භාණ්ඩයේ සැපයුම් මිල අනම්‍ය වීම හා Y භාණ්ඩයේ සැපයුම් මිල නම්‍ය වීම වේ.
e) X භාණ්ඩයේ සැපයුම් මිල නම්‍ය වීම හා Y භාණ්ඩයේ සැපයුම් මිල අනම්‍ය වීම වේ.

7) A භාණ්ඩයේ මිලෙහි වෙනසට අනුව ගණනය කරන ලද B භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාව 0.5 වූ අතර C භාණ්ඩයේ හරස් ඉල්ලුම් නම්‍යතාව 0.7 කි.භාණ්ඩ වර්ග සම්බන්දව ගත හැකි නිවැරදි නිගමනය වන්නේ,

a) A භාණ්ඩයේ ඉල්ලුම් මිල නම්‍ය වන අතර B භාණ්ඩයේ ඉල්ලුම් මිල අනම්‍ය වේ.
b) A භාණ්ඩය සපයන ආයතනයට B භාණ්ඩය සපයන ආයතනයට වඩා වෙළෙඳපොළ බලයක් පවතී
c) B භාණ්ඩය අත්‍යාවශ්‍ය භාණ්ඩයක් වන අතර C භාණ්ඩය සුඛෝපභෝගී භාණ්ඩයකි
d) B භාණ්ඩය සපයන ආයතනයට C භාණ්ඩය සපයන ආයතනයට වඩා වෙළෙඳපොළ බලයක් පවතී
e) B හා C භාණ්ඩ දෙවර්ගයේම ඉල්ලුම් මිල අනම්‍ය වේ

8) එක්තරා භාණ්ඩයක මිල රුපියල් 25ක් වන විට ඉල්ලුම් ප්‍රමාණය ඒකක 300ක් විය. මිල ඉල්ලුම් නම්‍යතාවය 3ක් වන මෙම භාණ්ඩයෙහි ඉල්ලුම් ප්‍රමාණය ඒකක 480ක් වන්නේ කවර මිලකදීද?

a) රුපියල් 12.50
b) රුපියල් 15.00
c) රුපියල් 20.00
d) රුපියල් 30.00
e) රුපියල් 25.00

9) පහතට බෑවුම් වන සරල රේඛීය ඉල්ලුම් වක්‍රයකට ආයතනය මුහුණ දී සිටී. මිල ඉල්ලුම් නම්‍යතාවය 1 ක් වන අවස්ථාවේදී ආයතනය නිෂ්පාදන කටයුතු සිදු කරයි නම්,

a) මිල අඩු කළොත් අය භාරය වැඩි වේ.
b) මිල වැඩි කළහොත් අය භාරය වැඩි වේ.
c) ඉල්ලුම් ප්‍රමාණය වැඩි වුවහොත් අයභාරය වැඩි වේ.
d) මිල වෙනස් කළහොත් අය භාරය අඩුවේ.
e) ඉල්ලුම් ප්‍රමාණය අඩු වුවහොත් අය භාරය අඩුවේ.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources
iexamhub

10) තරගකාරී වෙළඳපොලක අලෙවි වන එක්තරා භාණ්ඩයක මිල රුපියල් 2කේදී ඉල්ලුම් ප්‍රමාණය ඒකක 400කි. මිල රුපියල් 2ක බැගින් වැඩිවන විට ඉල්ලුම් ප්‍රමාණය ඒකක 80 බැගින් අඩුවේ. ඉල්ලුම් නම්‍යතාවය 1 ට සමාන වන්නේ කවර මිලකදීද?

a) රුපියල් 4 දී
b) රුපියල් 6 දී
c) රුපියල් 5 දී
d) රුපියල් 8 දී
e) රුපියල් 2 දී

11) Qd = -10P + 200 වන වෙළඳපොළක ඉල්ලුම් වක්‍රයක් සහිත භාණ්ඩයක සමතුලිත මිල රුපියල් 15 දී

| ඉල්ලුම් නම්‍යතාවය | පාරිභෝගික අතිරික්තය |
|---|---|
| a) -1.0 | 50 |
| b) -3.0 | 125 |
| c) -2.0 | 150 |
| d) -3.0 | 120 |
| e) -1.5 | 50 |

12) පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතින භාණ්ඩයක් මත විශේෂිත බද්දක් පැන වීම නිසා බිහි විය නොහැක්කේ මින් කුමක්ද?

a) භාණ්ඩයේ මිල බද්දේ ප්‍රමානයෙන් ම ඉහල යාම.
b) ආර්ථික අතිරික්තය නොවෙනස් ව පැවතීම.
c) රජයට කලින් ඇස්තමේන්තු කළ ප්‍රමාණයේම බදු අයභාරයක් උපයාගත හැකි වීම.
d) අධි බදු බරක් හෙවත් පරිවාරක පිරිවැයක් හට නොගැනීම.
e) සැපයුම් වක්‍රය බද්දේ ප්‍රමාණයෙන්ම වමට විතැන් වීම.

13) ඉල්ලුම් ශ්‍රිතයහි නම්‍යතාවය සෑම ලක්ෂයකදීම 1 ට වඩා අඩුවේ. සැපයුම් ශ්‍රිතය Qs = -100 + 5p ක් පවතින වෙළඳපොළක් මත සහනාධාර පනවනු ලැබුවහොත්,

a) සහනාධාර වාසියෙන් වැඩි කොටසක් ගැනුම්කරුවෝ ලබති.
b) සහනාධාර වාසිය මුළුමනින්ම ගැනුම්කරුවෝ ලබති.
c) සහනාධාර වාසියෙන් වැඩි කොටසක් අලෙවිකරුවෝ ලබති.
d) ගැනුම්කරුවෝ සහ අලෙවිකරුවෝ සමානව සහනාධාර වාසිය ලබති.
e) වාසිය දෙපිරිස අතර බෙදී යන ආකාරය තීරණය කළ නොහැක.


www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

14) තරගකාරී වෙළඳපොළක එක්තරා භාණ්ඩයක සමතුලිත මිල ඒකකයක් රුපියල් 20 ක් බව සලකන්න. දැන් මෙම වෙළඳපොළෙහි මිල රජය මැදිහත්ව දැන් පවතින සමතුලිත මිල මෙන් දෙගුණයක් ලෙස අවම මිලක් පනවනු ලබයි. වෙළඳපොළෙහි එක ගැනුම්කරුවකුගේ ඉල්ලුම් ශ්‍රිතය QD = 300 – 6P නම් අවම මිල එම ගැනුම්කරුවාගේ පාරිභෝගික අතිරික්තයට කරනු ලබන බලපෑම කුමක්ද?

a) රුපියල් 300කින් වැඩිවේ.
b) රුපියල් 300කින් අඩුවේ.
c) රුපියල් 2,400කින් වැඩිවේ.
d) රුපියල් 2,400කින් අඩුවේ.
e) රුපියල් 2,700කින් අඩුවේ.

15) රජය විසින් විකුණුම්කරුවන් මත ලබා දී තිබූ ඒකක සහනාධාරයක් ඉවත් කරන අවස්ථාවක් පහත රූප සටහනේ දැක්වේ.






www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

සහනාධාර ඉවත් කිරීම හේතුවෙන්,

| පාරිභෝගික අතිරික්තය | නිෂ්පාදන අතිරික්තය | සමාජ සුභසාධනය |
|---|---|---|
| a)bc ප්‍රමාණයෙන් අඩුවේ | efg ප්‍රමාණයෙන් අඩුවේ | d ප්‍රමාණයෙන් අඩුවේ. |
| b)bc ප්‍රමාණයෙන් අඩුවේ | efg ප්‍රමාණයෙන් අඩුවේ | d ප්‍රමාණයෙන් ඉහළ යයි. |
| c)efg ප්‍රමාණයෙන් අඩුවේ | bc ප්‍රමාණයෙන් අඩුවේ | d ප්‍රමාණයෙන් ඉහළ යයි. |
| d)efg ප්‍රමාණයෙන් ඉහළ යයි | bc ප්‍රමාණයෙන් ඉහළ යයි | d ප්‍රමාණයෙන් අහිමි වේ |
| e)efg ප්‍රමාණයෙන් පහළ යයි | bc ප්‍රමාණයෙන් ඉහළ යයි | d ප්‍රමාණයෙන් අහිමි වේ |

16) පරිමාණානුකූල පිරිමැසුම්

a. හැමවිටම නිශ්ප්‍රාමාණික ලාභ වැඩි වීමට හේතු වේ
b. සාමාන්‍ය පිරිවැය වැඩි වීමට හේතු වේ
c. බහු ජාතික සමාගම්වලට ප්‍රතිලාභ ගෙන දීමට හේතු වේ
d. නිමවුමේ සමානුපාතික වැඩි වීමට හේතු වේ
e. දිගු කාලීන සාමාන්‍ය පිරිවැය පහළ වැටීමට හේතු වේ

17) කෙටිකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ නිමවුම ශූන්‍ය වන විට මුළු පිරිවැය රුපියල් 360 ක් වේ. ඒකක 4 ක් නිපදවීමේදී මුළු පිරිවැය රුපියල් 560 ක් වේ නම්, එම නිමැවුම මට්ටමේදී සාමාන්‍ය විචල්‍ය පිරිවැය වනුයේ,

a. රුපියල් 90.00
b. රුපියල්140.00
c. රුපියල් 50.00
d. රුපියල් 200.00
e. රුපියල් 40.00

18) නිෂ්පාදන සාධකයක වර්තමාන භාවිතයේ ආවස්ථික පිරිවැයට සමාන වන්නේ,

a) ආර්ථික බදුකුලියට
b) ප්‍රමාණික ලාභයට
c) ආර්ථික ලාභයට
d) අවම සාමාන්‍ය පිරිවැයට
e) සංක්‍රාම ඉපයීමට


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

19) කෙටි කාලයේදී X භාණ්ඩය නිෂ්පාදනය කරන විට හටගන්නා ආන්තික පිරිවැය පහත දැක්වේ.

| නිමැවුම (ඒකක) | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 |
|---|---|---|---|---|---|---|---|
| ආන්තික පිරිවැය | 30 | 20 | 16 | 24 | 40 | 56 | 64 |

මුළු ස්ථාවර පිරිවැය රුපියල් 30 නම් කෙටි කාලයකදී සාමාන්‍ය මුළු පිරිවැය අවම වන්නේ කවර නිමැවුම් ප්‍රමාණයකද?

a) නිමැවුම් ඒකක 2 දී
b) නිමැවුම් ඒකක 4 දී
c) නිමැවුම් ඒකක 3 දී
d) නිමැවුම් ඒකක 5 දී
e) නිමැවුම් ඒකක 6 දී

20) පූර්ණ තරගකාරී ආයතනයක් දිගු කාලයේදී ප්‍රාමාණික ලාභ ඉපැයීමට මූලික හේතුව කුමක්ද?

a) මිල ආන්තික පිරිවැයට සමාන වීමයි.
b) ආයතනික පැවරුණු මිලක් යටතේ කටයුතු කිරීමයි.
c) සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය කිරීමයි.
d) ඉල්ලුම් වක්‍රය සිරස් රේඛාවක් වීමයි.
e) බාධාවකින් තොරව වෙළඳපොළට ඇතුළු වීමට හා ඉවත් වීමට හැකි වීමයි.

21) එක්තරා ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත පහත දැක්වේ.( රු.බිලියන)

| | |
|---|---|
| පුද්ගලික පරිභෝජනය | 2,600 |
| දළ ආයෝජන | 600 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම් | 400 |
| වැටුප් | 2,000 |
| ශුද්ධ අපනයන | -150 |
| ක්ෂය වීම් | 250 |

මෙහි ලබා දී ඇති දත්ත අනුව වියදම් ක්‍රමය (Expenditure Approach) භාවිතයෙන් දළ දේශීය නිෂ්පාදනය(GDP) ගණනය කරන්න.

a) රු.බිලියන 3,450
b) රු.බිලියන 3,350
c) රු.බිලියන 3,050
d) රු.බිලියන 5,000
e) රු.බිලියන 3,200

22) යම් කාලපරිච්ඡේදයක් තුළ නේවාසික ආර්ථික ඒකක එකතු කළ අගයේ වටිනාකම හැඳින්වෙන්නේ,

a) මූලික මිලට එකතු කළ අගය.
b) ගැනුම්කරුවන්ගේ මිලට දළ දේශීය නිෂ්පාදිතය.
c) දේශීය නිෂ්පාදිතය.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

d) නිෂ්පාදිතයන්ගේ මිලට මුළු එකතු කළ අගය.
e) රජය සහ පුද්ගලික අංශය එක්ව සම්පත් හිමිකාරිත්වය දරන ආර්ථික ක්‍රමය.

23) කමිස නිෂ්පාදකයෙක් රුපියල් 1,000 ක් වටිනා රෙදි සහ රුපියල් 200 ක් වටිනා නූල් සහ බොත්තම් මිලට ගෙන ඒවායෙන් කමිස නිපදවා එම එක් කමිසයක් රුපියල් 2,000 බැගින් පාරිභෝගිකයට අලෙවි කරයි. දළ දේශීය නිෂ්පාදනය සඳහා කමිස නිෂ්පාදකයාගේ දායකත්වය වන්නේ,

a) රුපියල් 3,200
b) රුපියල් 3,000
c) රුපියල් 2,200
d) රුපියල් 800
e) රුපියල් 2,000

24) පහත රේඛීය පරිභෝජන ශ්‍රිතයක් දැක්වේ. මෙම පරිභෝජිත ශ්‍රිතයෙහි ස්වායක්ත පරිභෝජන වියදම රුපියල් 4,000ක් වේ නම්, B ලක්ෂයේදී මුළු පරිභෝජන වියදම කොපමණද?




a) රුපියල් 18,000
b) රුපියල් 17,000
c) රුපියල් 16,000
d) රුපියල් 14,000
e) රුපියල් 10,000




iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

25) එක්තරා ආර්ථිකයක වැය කළ හැකි ආදායම රුපියල් 1,000 සිට රුපියල් 1,500 දක්වා ඉහළ යාමේදී පරිභෝජනය රුපියල් 1,000 සිට රුපියල් 1,400 දක්වා ඉහළ ගියේ නම්, එම ආර්ථිකයේ පරිභෝජන ශ්‍රිතය කුමක්ද?

a) C = 300 + 0.8 yd
b) C = 200 + 0.5 yd
c) C = 400 + 0.8 yd
d) C = 200 + 0.7 yd
e) C = 200 + 0.8 yd

26) පුද්ගලයකු තම ඉතුරුම් තැන්පතුවෙන් රුපියල් මිලියනයක් ලබාගෙන එය තම ජංගම ගිණුමේ තැන්පත් කළහොත් එය M1 සහ M2 මුදල් සැපයුමට බලපාන්නේ කෙසේද?

a) M1 මුදල් සැපයුම හා M2 මුදල් සැපයුම වෙනස් නොවේ.
b) M1 මුදල් සැපයුම වැඩිවේ. M2 මුදල් සැපයුම වෙනස් නොවේ.
c) M1 මුදල් සැපයුම වෙනස් නොවේ. M2 මුදල් සැපයුම වැඩිවේ.
d) M1 මුදල් සැපයුම අඩුවේ. M2 මුදල් සැපයුම වැඩිවේ.
e) M1 මුදල් සැපයුම වැඩිවේ. M2 මුදල් සැපයුම වැඩිවේ.

27) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විවට වෙළඳපොළ මිලදී ගැනීම් සිදුකරන විට,

a) වාණිජ බැංකු අධිසංචිත පහළ යන අතර ණය ප්‍රසාරණය කිරීමේ හැකියාව අඩුවේ.
b) අධි බලැති මුදල් ඉහළ යන අතර වාණිජ බැංකු වලට ණය ප්‍රසාරණය කිරීමේ හැකියාව වැඩිවේ.
c) වාණිජ බැංකු අධිසංචිත පහළ යන අතර අධි බලැති මුදල් පහළ යයි.
d) වාණිජ බැංකු අධිසංචිත ඉහළ යන අතර අධිබලැති මුදල් නොවෙනස්ව පවතී.
e) වාණිජ බැංකු වලට ණය ප්‍රසාරණය කිරීමේ හැකියාව වැඩිවන අතර අධිබලැති මුදල් නොවෙනස්ව පවතී.

28) උද්ධමනීය පරතරයක් පියවීමට යෝග්‍යතම ප්‍රතිපත්තිය වන්නේ,

a) සංචිත අවශ්‍යතා පහළ හෙළීම සහ හිඟ අයවැය ලේඛනයක් ක්‍රියාවට නැංවීම.
b) සංචිත අවශ්‍යතා ඉහල නැංවීම සහ වට්ටම් අනුපාතික පහළ හෙළීම.
c) මුදල් සැපයුම වැඩි කිරීම, රජයේ වියදම් සහ බදු අඩු කිරීම.
d) මුදල් සැපයුම අඩු කිරීම, රජයේ වියදම් සහ බදු අඩු කිරීම.
e) සංචිත අවශ්‍යතා ඉහල නැංවීම, රජයේ වියදම් අඩු කිරීම සහ බදු වැඩි කිරීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

29) ඒකාධිකාරී බැංකු පද්ධතියක් තනි වාණිජ බැංකුවකින් සමන්විත වන අතර ගනුදෙනුකරුවෙකු මෙම බැංකුවේ රුපියල් 200,000 තැන්පත් කර ඇත. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් නම්, මෙම තැන්පතුව නිසා ලබා දිය හැකි උපරිම ණය මුදලේ වටිනාකම කොපමණද?

a) රුපියල් 200,000
b) රුපියල් 18,000
c) රුපියල් 20,000
d) රුපියල් 180,000
e) රුපියල් 20,000

30) වාණිජ බැංකු පද්ධතිය තුළ කටයුතු කරන එක් වාණිජ බැංකුවක් සතුව රුපියල් මිලියන 400ක සංචිත සහ රුපියල් මිලියන 3,500ක බැංකු තැන්පතු පවතී. මෙම බැංකුවේ ගනුදෙනුකරුවෙකු රුපියල් මිලියන 100 ක් අලුතෙන් තැන්පත් කරයි. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%ක් නම් දැන් බැංකු සතු අධිසංචිත ප්‍රමාණය කොපමණද?

a) රුපියල් මිලියන 380
b) රුපියල් මිලියන 240
c) රුපියල් මිලියන 140
d) රුපියල් මිලියන 450
e) රුපියල් මිලියන 60

31) ව්‍යවහාර මුදල් ළඟ තබා ගැනීම අනාරක්ෂිත යැයි මහජනතාව තුළ පවතින මතය ඉහළ යාමක්,

a) වාණිජ බැංකුවල තැන්පතු පහළ යාමට බලපායි.
b) වාණිජ බැංකුවල තැන්පතු වලට බලපෑමක් ඇති නොකරයි.
c) වාණිජ බැංකුවල තැන්පතු ඉහළ යාමට බලපාන අතර වාණිජ බැංකුවල ණය ප්‍රසාරණ හැකියාව ඉහළ දමයි
d) වාණිජ බැංකුවල රජයේ ප්‍රසාරණ හැකියාව සඳහා කිසිදු බලපෑමක් ඇති නොකරයි.
e) ආර්ථිකයේ මුදල් සැපයුම පහළ යාමට බලපායි.

32) අර්ධ පොදු භාණ්ඩ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
a) සාමූහිකව පරිභෝජනය කළ හැකි භාණ්ඩයක් වන අතර පරිභෝජනය සීමා කළ හැකිය.
b) මෙම භාණ්ඩ සඳහා කිසිදු විටෙක මිලක් අය කළ නොහැකිය.
c) ධාරිතා මට්ටම තෙක් පරිභෝජනයෙන් තරගකාරීත්වයක් නොමැති පරිභෝජන සීමා කළ හැකි භාණ්ඩයෙකි.
d) පරිභෝජනය සීමා කර නොහැකි පරිභෝජනය තරගකාරීත්වයක් නොපවතින භාණ්ඩයකි.
e) සෑම විටම සෘණ බාහිරතා ගෙන දෙන භාණ්ඩයෙකි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

33) ආණ්ඩුව අසමත් වීම් සෑම විටම හට ගනුයේ,

a) භාණ්ඩ හා සේවා කාර්යක්ෂමව බෙදා වෙන් කිරීමට මිල ක්‍රමය අපොහොසත් වන විටය.
b) වෙළඳපොළෙහි බාහිරතා දක්නට ලැබෙන බැවිනි.
c) වෙළඳපොළ මගින් පොදු භාණ්ඩ හා සේවා නොසපයන විටය.
d) වෙළඳපොළ අසමත් වීම් ඉවත් කිරීමට ආණ්ඩුව අපොහොසත් වන විටය.
e) වෙළඳපොළෙහි සමාජ පිරිවැය සමාජ ප්‍රතිලාභ වලට වඩා විශාල වන විටය.

34) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බදු වර්ග අතුරින් අනුක්‍රමික, ප්‍රතික්‍රමික සහ සමානුපාතික බදු සඳහා නිවැරදි පිළිතුර කුමක්ද?

| | අනුක්‍රමික බද්ද | ප්‍රතික්‍රමික බද්ද | සමානුපාතික බද්ද |
|---|---|---|---|
| a) | පුද්ගල ආදායම් බද්ද | සුරා බද්ද | එකතු කළ අගය මත බද්ද |
| b) | පුද්ගල ආදායම් බද්ද | එකතු කළ අගය මත බද්ද | සුරා බද්ද |
| c) | නිෂ්පාදිත බද්ද | පුද්ගල ආදායම් බද්ද | එකතු කළ අගය මත බද්ද |
| d) | එකතු කළ අගය මත බද්ද | වරාය හා ගුවන්තොටුපළ සංවර්ධන බද්ද | විදුලි සංදේශ බද්ද |
| e) | නිෂ්පාදිත බද්ද | එකතු කළ අගය මත බද්ද | පුද්ගල ආදායම් බද්ද |

35) නිදහස් තරගකාරී වෙළඳපොළක නිෂ්පාදනය කෙරෙන එක්තරා භාණ්ඩයක සමතුලිත නිමැවුම් මට්ටමේදී එහි ආන්තික පෞද්ගලික හා බාහිර ප්‍රතිලාභත් ආන්තික පෞද්ගලික හා බාහිර පිරිවැයත් වගුවෙහි දැක්වේ.

| | රුපියල් මිලියන | | රුපියල් මිලියන |
|---|---|---|---|
| පෞද්ගලික ප්‍රතිලාභ | 30 | ආන්තික පෞද්ගලික පිරිවැය | 10 |
| බාහිර ප්‍රතිලාභ | 20 | ආන්තික බාහිර පිරිවැය | 0 |

මෙම වෙළඳපොළට රජය මැදිහත් වීමෙන් සම්පත් බෙදා වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවිය හැකිය. මක් නිසාද යත් එම භාණ්ඩය,

a) පොදු භාණ්ඩයක් බැවිනි
b) අවශ්‍ය භාණ්ඩයක් බැවිනි
c) ශුභ සාධක භාණ්ඩයක් බැවිනි
d) ගෝලීය පොදු භාණ්ඩයක් බැවිනි
e) බාල භාණ්ඩයක් බැවිනි


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers - Study Resources

36) ශ්‍රී ලංකාවේ සහ ඉන්දියාවේ ශ්‍රම ඒකකයක් තුළින් නිපදවිය හැකි මෝටර් රථ සහ බයිසිකල් ඒකක සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

| | මෝටර් රථ | බයිසිකල් |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 20 | 10 |
| ඉන්දියාව | 15 | 45 |

රටවල් දෙක අතර වාසිදායක වෙළඳ අනුපාතය වන්නේ,

a) කාර් ඒකකයට බයිසිකල් ඒකක 0.5ත් 3ත් අතර ප්‍රමාණයක්
b) බයිසිකල් ඒකකයකට කාර් ඒකක 0.22ත් 4.5ත් අතර ප්‍රමාණයක්
c) කාර් ඒකකයකට බයිසිකල් ඒකක 0.75ත් 1.33ත් අතර ප්‍රමාණයක්
d) බයිසිකල් ඒකකයකට කාර් ඒකක 0.5ත් 3ත් අතර ප්‍රමාණයක්
e) කාර් ඒකකයකට බයිසිකල් ඒකක 0.33ත් 2ත් අතර ප්‍රමාණයක්

37) රටක භාණ්ඩ වෙළඳ අනුපාතය එහි පැවති අගය 100 සිට 120 දක්වා ඉහළ ගොස් ඇත. මෙම වෙනස්වීම සඳහා අපනයන මිල දර්ශකයෙහි සහ ආනයන මිල දර්ශකයෙහි කවර වෙනස්කම් සිදු විය යුතුද?

| | අපනයන මිල දර්ශකය | ආනයන මිල දර්ශකය |
|---|---|---|
| a) | +20% | -20% |
| b) | +20% | +20% |
| c) | -20% | 0% |
| d) | +40% | +50% |
| e) | -40% | -50% |

38) සඵල ආරක්ෂක අනුපාතය ඉහළ යාමට බලපාන සාධකයක් වන්නේ,

a) අවසාන නිෂ්පාදිතය මත පනවනු ලබන තීරු බදු අනුපාතිකය ඉහළ අගයක් ගැනීම.
b) ආනයනික යෙදවුම් මත පණුවනු ලබන තීරු බදු අනුපාතය ඉහළ අගයක් ගැනීම.
c) භාණ්ඩයේ වටිනාකම තුළ ඇතුලත් ආයතනික යෙදවුම් ඉහළ අගයක් ගැනීම.
d) අවසාන නිෂ්පාදිතය මත පනවනු ලබන තීරු බදු අනුපාතිකය පහළ අගයක් ගැනීම.
e) අපනයන භාණ්ඩ මත පනවනු ලබන සහනාධාර ඉහළ අගයක් ගැනීම.

39) ආරක්ෂක වාදයට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්කයක් වන්නේ,
a) නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගත හැකිවීම.
b) වෙළඳ ප්‍රපාතය වළක්වා ගත හැකිවීම.
c) ගෙවුම් ශේෂ දුෂ්කරතා ඇතිවීම.
d) විදේශ වෙළඳාම සංකෝචනය වීම නිසා ජාතික ආදායම සංකෝචනය වීම.
e) දියුණු තාක්ෂණය සංක්‍රමණය වීම සීමා වීම.


iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

40) අනෙකුත් කරුණු නොවෙනස්ව තිබියදී දේශීය මුදල් ඒකකයේ බාහිර අගය අඩුවීමක්,

a) අපනයනය කරනු ලබන භාණ්ඩවල විදේශ මිල ඉහළ නංවයි.
b) ආනයනය කරනු ලබන භාණ්ඩ වල දේශීය මිල පහල නංවයි.
c) එම රටට විදේශීය සංචාරකයන් පැමිණීම සීමා කරයි.
d) එම රටට විදේශීය සංචාරකයන් පැමිණීම දෛර්යමත් කරයි.
e) ආනයනය කරනු ලබන භාණ්ඩ වල විදේශ මිල ඉහළ නංවයි.

41) කිසියම් රටක ගෙවුම් ශේෂ ලේඛණයට අදාළ දත්ත පහත දැක්වේ. (සංඛ්‍යා රුපියල් බිලියන වලිනි)

| | |
|---|---|
| භාණ්ඩ අපනයන | 100 |
| භාණ්ඩ ආනයන | 150 |
| සේවා ගිණුමේ අතිරික්තය | 75 |
| විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම | 125 |
| විදේශ සංචිත ආයෝජන | 25 |
| ශුද්ධ ප්‍රාග්ධන සංක්‍රාම | 65 |
| විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම් | 150 |
| විදේශ ශුද්ධ පෞද්ගලික වර්තන සංක්‍රාම | 225 |

වර්තන ගිණුමේ ශේෂය කොපමණද?

a) රුපියල් බිලියන 315
b) රුපියල් බිලියන 225
c) රුපියල් බිලියන 290
d) රුපියල් බිලියන 250
e) රුපියල් බිලියන 465

42) විදේශ රටකින් ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ගයක් ඉදිකිරීම සඳහා ලැබුණු ව්‍යාපෘති දීමනාවක් ගෙවුම් ශේෂ ලේඛනයේ වාර්තා කරනු ලබන නිවැරදි ද්විත්ව සටහන කුමක්ද?

a) මූල්‍ය ගිණුම හර, වෙළඳ ගිණුම බැර
b) මූල්‍ය ගිණුම හර, ප්‍රාථමික ආදායම් ගිණුම බැර
c) මූල්‍ය ගිණුම හර, ප්‍රාග්ධන ගිණුම බැර
d) වෙළඳ ගිණුම හර, මූල්‍ය ගිණුම බැර
e) ප්‍රාග්ධන ගිණුම හර, මූල්‍ය ගිණුම බැර

43) ශ්‍රී ලංකාව වෙත සංචාරක ඉපයීම් ඉහළ යන විට බොහෝ සෙයින් සිදුවිය හැක්කේ,

a) දේශීය විනිමය ඉල්ලුම ඉහළ යන අතර විනිමය අනුපාතයේ අගය ඉහළ යාමක් වාර්තා කරයි.
b) දේශීය විනිමය සැපයුම ඉහළ යන අතර විනිමය අනුපාතයේ අගය ඉහළ යාමක් වාර්තා කරයි.


iexamhub www.iexamhub.com Your Trusted Partner for Exam Success Past Papers Model Answers • Study Resources

c) විදේශ විනිමය ඉල්ලුම ඉහළ යන අතර විනිමය අනුපාත අවප්‍රමාණය වීමක් සිදු වේ.
d) විදේශ විනිමය සැපයුම ඉහළ යන අතර විනිමය අනුපාත අවප්‍රමාණ වීමක් සිදුවේ.
e) දේශීය විනිමය සැපයුම ඉහළ යන අතර විනිමය අනුපාත ක්ෂය වීමක් වාර්තා කරයි.

44) දේශීයව නිෂ්පාදනය කරන සපත්තු ජෝඩුවක මිල රුපියල් 2,500ක් වන අතර ඒ සඳහා රුපියල් 1,000 ආනයනික යෙදවුම් භාවිතා කරයි. ඒ හා සමාන සපත්තු ජෝඩුවක් විදේශ රටකින් එම මිලට ආනයනය කරන අතර රජය දේශීය නිෂ්පාදකයා රැකගැනීමේ අරමුණින් ආනයනික සපත්තු මත 20%ක තීරු බදු සහ යෙදවුම් මත 10%ක තීරු බදු පැන වූයේ නම් සඵල ආරක්ෂක අනුපාතය වන්නේ,

a) 33.33%
b) 20%
c) 30%
d) 10%
e) 26.66%

45) මානව සංවර්ධනය යනුවෙන් හැඳින්වෙන්නේ,

a) කිසියම් රටක භාණ්ඩ හා සේවා තොගයේ සිදුවන ප්‍රමාණාත්මක වැඩිවීමකි.
b) රටක නිෂ්පාදන ධාරිතාවේ සිදුවන ඉහළ යාමකි.
c) මිනිසාට තම මානව හැකියාවන් වර්ධනය කර ගැනීමටත් එම හැකියාවන් විවිධ ක්ෂේත්‍රවල භාවිතා කිරීමටත් ඉඩ ප්‍රස්ථා සැලසීමයි.
d) මිනිසාගේ ජීවිතය අයහපත් තත්ත්වයක සිට යහපත් තත්ත්වයකට මාරුවීමයි.
e) ව්‍යුහාත්මක වෙනස්කම් හා බැඳුණු ආර්ථික වෘද්ධි ක්‍රියාවලියයි.

46) මානව සංවර්ධක දර්ශකය මිනුම් කිරීමේදී ඇතුළත් කරනුයේ,

a) උපතේදී ආයු අපේක්ෂණය, ළමා මරණ අනුපාතිකය, වැඩිහිටි මරණ අනුපාතිකය
b) යැපුම් අනුපාතිකය, අධ්‍යාපනය, සාක්ෂරතාවය
c) උපතේදී ආයු අපේක්ෂණය, අධ්‍යාපනය, ක්‍රය ශක්ති සාම්‍ය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම
d) සෞඛ්‍ය, අධ්‍යාපනය, සැපයුම් අනුපාතිකය
e) යැපුම් අනුපාතිකය, සෞඛ්‍ය, අධ්‍යාපනය



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers • Study Resources

47) A හා B ආර්ථිකයට අදාළ ලොරන්ස් වක්‍රය පහත රූප සටහනේ දැක්වේ.




A හා B ආර්ථික සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වන්නේ,

a) B ආර්ථිකයට වඩා A ආර්ථිකයේ වඩා සාධාරණ වූ ආදායම් ව්‍යාප්තියක් දැකිය නොහැක.
b) B ආර්ථිකයට වඩා A ආර්ථිකයේ වඩා සාධාරණ වූ ආදායම් ව්‍යාප්තියක් දැකිය හැක.
c) A හා B ආර්ථිකවල ගිනි සංගුණක එකිනෙක සමාන වේ.
d) A ආර්ථිකයට වඩා B ආර්ථිකයේ ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය අඩුය.
e) B ආර්ථිකයට වඩා A ආර්ථිකයේ ආදායම් ව්‍යාප්තියේ විෂමතාවය වැඩිය.

48) සංවර්ධනය මිනුම් කරනු ලබන ආර්ථික දර්ශක හා සංයුක්ත දර්ශක කීපයක් පහත දැක්වේ. ඒවා නිවැරදිව වර්ග කර ඇත්තේ,

A - භෞතික ජීවන තත්ත්ව දර්ශකය
B - මානව සංවර්ධන දර්ශකය
C - ප්‍රතිශීර්ෂ ආදායම
D - මානව ප්‍රාග්ධන දර්ශකය
E - ආර්ථික වර්ධන අනුපාතය

| | ආර්ථික දර්ශක | සංයුක්ත දර්ශක |
|---|---|---|
| a) | A, B, C | D, E |
| b) | C, D | A, B, E |
| c) | B, C, E | A, D |
| d) | C, E | A, B, D |
| e) | C, D, E | A, B |




www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

49) අස්වැසුම සමාජ සුභසාධක වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබන්නන් කාණ්ඩගත කර ඇත. එම කාණ්ඩයට ඇතුළත් නොවන්නේ පහත කවරක්ද?

a) සංක්‍රාන්ති දුප්පතුන් කාණ්ඩය
b) අවදානම් කාණ්ඩය
c) අවදානයට ලක් වූ කාණ්ඩය
d) අන්ත දුප්පත් කාණ්ඩය
e) දුප්පත් කාණ්ඩය

50) ශ්‍රී ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් පවතින අවිනිශ්චිතතා ඉවත් කිරීම සඳහා වඩා යෝග්‍ය වන්නේ පහත කවරක්ද?

a) මහ බැංකුවේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම.
b) වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ හා ස්ථාවර මට්ටමකින් පවත්වාගෙන යාම.
c) ණය වියදම් තාර්කීකරණය කිරීම සහ සැමට සමානව බෙදී යාමට හැකි ලෙසින් සුභසාධක වියදම් ඉහළ දැමීමට කටයුතු කිරීම.
d) ණය ප්‍රතිව්‍යුහගත කිරීම, සාර්ථකව නිම කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රතිසංස්කරණය අඛණ්ඩව පවත්වාගෙන යාම.
e) පාලන දුර්වලතා සහ දූෂණ අවදානම් පිළිබඳ ගැටළු විසඳීම සඳහා හඳුනාගත් ක්‍රියාමාර්ග නිසි ලෙස ක්‍රියාවට නැංවීම.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

Q1)

I. මෙම ප්‍රකාශය සමඟ සම්පූර්ණයෙන්ම එකඟ විය නොහැක.

හේතුව: ආර්ථික වර්ධනය යනු රටක නිෂ්පාදන ධාරිතාව ඉහළ යාමයි. එමඟින් මිනිස් අවශ්‍යතා වැඩි ප්‍රමාණයක් තෘප්තිමත් කිරීමට සම්පත් ප්‍රමාණය වැඩි වුවද, මිනිස් අවශ්‍යතා අසීමිත බැවින් සම්පත් හිඟකම යන මූලික ආර්ථික ගැටලුව සම්පූර්ණයෙන් තුරන් කළ නොහැක. ආර්ථිකය වර්ධනය වන විට මිනිසාගේ අලුත් අවශ්‍යතා සහ වුවමනාද ඒ හා සමානව හෝ ඊට වඩා වේගයෙන් වර්ධනය වේ.

II.

| **භූමිය** | **ස්වභාවික ප්‍රාග්ධනය** |
|---|---|
| නිෂ්පාදන සාධකයක් ලෙස ස්වභාවයෙන් ලැබෙන සියලු සම්පත් ඇතුළත් වේ. | ආර්ථික වටිනාකමක් ඇති ස්වභාවික සම්පත් තොගයයි. |
| නිෂ්පාදනය සඳහා භාවිත කරන භූමි, ජලය, වනාන්තර ආදිය ඇතුළත් වේ. | වනාන්තර, ඛනිජ, ජල සම්පත්, ජෛව විවිධත්වය වැනි සම්පත් අනාගත ප්‍රතිලාභ ලබාදෙන වත්කම් ලෙස සැලකේ. |
| නිෂ්පාදන සාධකයකි. | ප්‍රාග්ධන වත්කමකි. |

iii. **ආර්ථික නොවන සම්පත් (Non-Economic Resources / Free Resources):**

- සොබාදහමෙන් අසීමිතව ලැබෙන, මිනිස් උවමනා සැපිරීමට වඩා සැපයුම ඉතා විශාල සම්පත් වේ (උදා: සූර්යාලෝකය, වාතය, සාගර ජලය).
- භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදාගත හැකි ස්වභාවික ප්‍රාග්ධන හෝ සාධක මට්ටමේ පවතින සම්පත් වේ.
- මේවායේ හිඟකමක් නැති අතර, විකල්ප පිරිවැයක් ශූන්‍ය වේ.

- **නොමිලේ භාණ්ඩ (Free Goods):**
    - මේවා මිනිසාගේ පරිභෝජනය සඳහා සෘජුවම උපකාරී වන, කිසිදු හිඟකමක් නොමැති, කිසිදු මිලක් හෝ පරිශ්‍රමයක් රහිතව පරිභෝජනය කළ හැකි භාණ්ඩ වේ.
    - බොහෝ විට ආර්ථික නොවන සම්පත් උපයෝගී කරගෙන (කිසිදු නිෂ්පාදන පිරිවැයක් නොදරා) මිනිසා සෘජුවම භුක්ති විඳින දේ මීට අයත් වේ (උදා: හුස්ම ගන්නා වාතය, මුහුදු වෙරළක ඇති වැලි, ස්වභාවික ළිඳකින් බොන ජලය).
    - මේවායේද විකල්ප පිරිවැය සදාකාලිකවම ශුන්‍ය වේ.

පාරිභෝගිකයෙකුට කිසිදු මුදලක් නොගෙවා (නොමිලේ) ලැබෙන සෑම භාණ්ඩයක් හෝ සේවාවක්ම ආර්ථික විද්‍යාත්මක අර්ථයෙන් "නොමිලේ භාණ්ඩ" (Free Goods) ලෙස හැඳින්විය නොහැක.

- **ආර්ථික භාණ්ඩ නොමිලේ සැපයීම:** රජය හෝ වෙනත් පුණ්‍යායතන මගින් මහජනතාවට නොමිලේ ලබාදෙන ඇතැම් භාණ්ඩ (උදා: නොමිලේ දෙන පාසල් පොත්, නිල ඇඳුම්, රජයේ රෝහල්වලින් දෙන නොමිලේ ඖෂධ/සෞඛ්‍ය සේවා, නිදහස් අධ්‍යාපනය) සැබෑ නොමිලේ භාණ්ඩ නොවේ. ඒවා **ආර්ථික භාණ්ඩ (Economic Goods)** වේ.
- **හිඟ සම්පත් භාවිතය:** මෙම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රමය, ප්‍රාග්ධනය, භූමිය වැනි හිඟ ආර්ථික සම්පත් වැය කිරීමට සිදුව ඇත.
- **විකල්ප පිරිවැය (Opportunity Cost):** පාරිභෝගිකයා ඒ සඳහා සෘජුවම මුදල් නොගෙවුවත්, රජය විසින් මහජන බදු මුදල් වැය කරමින් ඒවා නිෂ්පාදනය කර ඇත. එම සම්පත් වෙනත් විකල්ප සංවර්ධන කටයුත්තකට (උදා: මහාමාර්ග ඉදි කිරීමට) යෙදවීමට තිබූ අවස්ථාව අහිමි වන බැවින්, මෙහිදී **විකල්ප පිරිවැයක් හටගනී**.

ආර්ථික විද්‍යාවේදී භාණ්ඩයක් "නොමිල භාණ්ඩයක්" වන්නේ එහි **විකල්ප පිරිවැය ශුන්‍ය නම් පමණි**. එබැවින්, වෙනත් පාර්ශවයක් විසින් පිරිවැය දරා පාරිභෝගිකයාට නොමිලේ බෙදාහරින භාණ්ඩ සියල්ලම ආර්ථික භාණ්ඩ මිස, නොමිල භාණ්ඩ (Free Goods) නොවේ.

### iv.**තාක්ෂණික දැනුම**

- නිෂ්පාදනය සිදු කරන ක්‍රම, ක්‍රියාවලි හා නවෝත්පාදන පිළිබඳ දැනුමයි.
- උදා: නව නිෂ්පාදන තාක්ෂණයක්, AI භාවිතය.

**මානව ප්‍රාග්ධනය**

- අධ්‍යාපනය, පුහුණුව, අත්දැකීම් හා සෞඛ්‍ය මඟින් මිනිසුන් තුළ ගොඩනැගෙන හැකියාවන්ය.
- උදා: දක්ෂ ඉංජිනේරුවෙක්, පුහුණු ගුරුවරයෙක්.

තාක්ෂණික දැනුම යනු දැනුම හා ක්‍රමවේදයන් වන අතර, මානව ප්‍රාග්ධනය යනු එම දැනුම භාවිත කරන මිනිස් සම්පතයි.

v.

විධාන ආර්ථිකයක (Command Economy) "කා සඳහා නිෂ්පාදනය කරන්නේද?" (තීරණය කරන ලද භාණ්ඩ හා සේවා සමාජයේ සාමාජිකයන් අතර බෙදා හරින්නේ කෙසේද?) යන ගැටලුව මධ්‍යම සැලසුම් අධිකාරියක් මඟින් තීරණය කරනු ලබයි. එහිදී පැනනගින ප්‍රධාන ප්‍රායෝගික දුෂ්කරතා 4ක් පහත පරිදි පෙන්වා දිය හැක:

1. **පාරිභෝගික රුචිකත්වයන් සහ සැබෑ අවශ්‍යතා හඳුනාගැනීමේ අපහසුව:** මිල යාන්ත්‍රණයක් නොමැති නිසා, පාරිභෝගිකයන් සැබවින්ම කැමති සහ අවශ්‍ය දේ පිළිබඳ නිවැරදි දත්ත හෝ සංඥා (Price Signals) මධ්‍යම සැලසුම්කරුවන්ට ලැබෙන්නේ නැත. මේ නිසා භාණ්ඩ බෙදාහැරීමේදී පාරිභෝගික රුචිකත්වයන් මඟහැරී යයි.
2. **භාණ්ඩ හිඟය සහ පෝලිම් ඇතිවීම (Shortages and Queueing):** රජය විසින් මිල පාලනය කිරීම සහ සලාක ක්‍රම (Rationing) මඟින් භාණ්ඩ බෙදාහැරීමට යාමේදී, පාරිභෝගික ඉල්ලුමට සරිලන පරිදි නිසි වේලාවට භාණ්ඩ සැපයීමට නොහැකි වේ. මෙයින් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා දිගු පෝලිම් සහ කළු කඩ (Black Markets) නිර්මාණය වේ.
3. **ප්‍රශස්ත ලෙස සම්පත් උපයෝජනය නොවීම සහ අකාර්යක්ෂමතාව (Inefficient Distribution):** භාණ්ඩ බෙදාහැරීම සිදුවන්නේ වෙළෙඳපොළ තරඟකාරීත්වය මත නොව රජයේ නිලධාරීන්ගේ තීරණ මත බැවින්, සැබවින්ම භාණ්ඩ අවශ්‍ය පුද්ගලයාට වඩා වෙනත් පාර්ශවයන් වෙත භාණ්ඩ ලැබීමට ඇති ඉඩකඩ වැඩිය (පක්ෂග්‍රාහීත්වය හෝ දූෂණය හේතුවෙන්).
4. **නිෂ්පාදනය සහ බෙදාහැරීම උදෙසා ඉහළ පරිපාලන පිරිවැයක් දැරීමට සිදුවීම:** මුළු රටේම ජනගහනය සඳහා භාණ්ඩ සාධාරණව බෙදාහැරීමට විශාල රාජ්‍ය නිලධාරී මණ්ඩලයක්, සැලසුම් කමිටු සහ සංකීර්ණ බෙදාහැරීමේ ජාලයන් නඩත්තු කිරීමට සිදු වේ. මෙය අධික කාලයක් සහ පිරිවැයක් වැයවන ප්‍රායෝගිකව දුෂ්කර ක්‍රියාවලියකි.

Q2)

I. සාමාන්‍ය ඉල්ලුම් නියමයට පටහැනිව, භාණ්ඩයක මිල ඉහළ යනවිට එහි ඉල්ලුම් ප්‍රමාණය ද ඉහළ යාමට (ධන බෑවුමක් සහිත ඉල්ලුම් රේඛාවක් නිර්මාණය වීමට) බලපාන ප්‍රධාන අවස්ථා 3ක් පහත පරිදි වේ:

**ගිෆන් භාණ්ඩ (Giffen Goods):**
පහත් භාණ්ඩ විශේෂයක් වන මෙහි මිල වැඩි වන විට, පාරිභෝගිකයාගේ සැබෑ ආදායම දැඩි ලෙස පහත වැටේ. එවිට වෙනත් මිල අධික ආදේශක භාණ්ඩ මිලදී ගැනීමට නොහැකි වන පාරිභෝගිකයා, තම ජීවිතය පවත්වා ගැනීම සඳහා මෙම පහත් භාණ්ඩය වැඩි වශයෙන් මිලදී ගනී (මෙහිදී සෘණ ආදායම් ප්‍රතිවිපාකය, ධන ආදේශන ප්‍රතිවිපාකයට වඩා ප්‍රබල වේ).

**වෙබ්ලන් / ප්‍රදර්ශනාත්මක භාණ්ඩ (Veblen):**
සමාජයේ තත්ත්වය, ප්‍රභූත්වය හෝ ධනවත්කම ප්‍රදර්ශනය කිරීම සඳහා මිලදී ගන්නා සුඛෝපභෝගී භාණ්ඩ (උදා: දියමන්ති, ඉහළ මිලැති ක්‍රීඩා මෝටර් රථ, සන්නාමකරණය කළ ඔරලෝසු). මේවායේ මිල වැඩි වන තරමට ඒවායේ ඇති ආකර්ෂණය සහ ඉල්ලුම වැඩි වේ.

**අනාගත මිල වෙනස්වීම් පිළිබඳ අපේක්ෂාවන් (Speculative Expectations):**
යම් භාණ්ඩයක මිල අනාගතයේදී තවත් වේගයෙන් ඉහළ යනු ඇතැයි පාරිභෝගිකයන් අපේක්ෂා කරන විට (උදා: කොටස් වෙළෙඳපොළ, රන් හෝ උද්ධමනකාරී වටපිටාවක අත්‍යවශ්‍ය භාණ්ඩ), වර්තමානයේ මිල ඉහළ යමින් පැවතිය ද පසුව සිදුවන පාඩුව වළක්වා ගැනීමට වර්තමාන ඉල්ලුම් ප්‍රමාණය ඉහළ දමයි.

II. භාණ්ඩ වර්ගය: පහත් භාණ්ඩ (Inferior Goods)
භාණ්ඩ වර්ගය: සුඛෝපභෝගී භාණ්ඩ (Luxury Goods)
භාණ්ඩ වර්ගය: අත්‍යවශ්‍ය භාණ්ඩ (Essential Goods / Necessity Goods)

III. ගිෆන් භාණ්ඩයක් යනු ඉතාමත් පහත් තත්ත්වයේ භාණ්ඩ (Highly Inferior Goods) විශේෂයකි. මිල අඩු වීමේදී සාමාන්‍ය භාණ්ඩ මෙන් නොව, ගිෆන් භාණ්ඩවල ඉල්ලුම් ප්‍රමාණය අඩු වේ. මෙයට හේතුව ආදේශන සහ ආදායම් ප්‍රතිවිපාක ප්‍රතිවිරුද්ධ දිශාවන්ට ක්‍රියාත්මක වීමයි.

එය සිදුවන ආකාරය ,

**ආදේශන ප්‍රතිවිපාකය (Substitution Effect):** ගිෆන් භාණ්ඩයක මිල අඩු වන විට, ආදේශන ප්‍රතිවිපාකය නිසා වෙනත් භාණ්ඩවලින් ඉවත් වී මෙම භාණ්ඩය වැඩිපුර මිලදී ගැනීමට පාරිභෝගිකයා පෙළඹේ. එනම්, ආදේශන ප්‍රතිවිපාකය මඟින් ඉල්ලුම් ප්‍රමාණය ඉහළ නැංවීමට බලපෑම් කරයි .

**ආදායම් ප්‍රතිවිපාකය (Income Effect):** භාණ්ඩයේ මිල අඩු වන විට පාරිභෝගිකයාගේ 'සැබෑ ආදායම' (Real Income) ඉහළ යයි. ගිෆන් භාණ්ඩ අතිශය පහත් භාණ්ඩ නිසා, සැබෑ ආදායම ඉහළ යත්ම පාරිභෝගිකයා මෙම භාණ්ඩය පරිභෝජනය කිරීම අඩු කර වඩාත් ගුණාත්මක ඉහළ භාණ්ඩ මිලදී ගැනීමට පෙළඹේ. එනම්, මෙහිදී ආදායම් ප්‍රතිවිපාකය මඟින් ඉල්ලුම් ප්‍රමාණය පහළ හෙළීමට බලපෑම් කරයි (සෘණ බලපෑමක්).

**අවසාන ප්‍රතිඵලය:** ගිෆන් භාණ්ඩවල පවතින සුවිශේෂී ලක්ෂණය වන්නේ, ඉල්ලුම අඩු කිරීමට බලපාන **සෘණ ආදායම් ප්‍රතිවිපාකය**, ඉල්ලුම වැඩි කිරීමට බලපාන **ආදේශන ප්‍රතිවිපාකයට වඩා බෙහෙවින් ප්‍රබල (Income Effect > Substitution Effect)** වීමයි.

IV. 0.5=( Y /10)*(20/50)    ΔQD=Y

0.5=2Y/50

(0.5*50)/2=Y

12.5=Y

X=50+12.5

X=62.5

V. **සැපයුම් වක්‍රය ස්ථාවරව තිබියදී ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්වීම**

සමතුලිතතාවයට වන බලපෑම: ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වූ විට (ඉල්ලුම ඉහළ යාම නිසා), වෙළඳපොළේ නව සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය යන දෙකම ඉහළ යයි.

පාරිභෝගික අතිරික්තය (Consumer Surplus): භාණ්ඩය සඳහා ඇති කැමැත්ත/උපයෝගීතාව ඉහළ යන බැවින් සහ වැඩි පාරිභෝගිකයින් පිරිසක් වෙළඳපොළට එකතු වන බැවින්, අවසාන ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික අතිරික්තය ඉහළ යයි.

නිෂ්පාදන අතිරික්තය (Producer Surplus): වෙළඳපොළ මිල ඉහළ යන බැවින් සහ නිෂ්පාදකයින් වැඩි ප්‍රමාණයක් වැඩි මිලකට අලෙවි කරන බැවින්, නිෂ්පාදන අතිරික්තය ද ඉහළ යයි

**ඉල්ලුම් වක්‍රය ස්ථාවරව තිබියදී සැපයුම් වක්‍රය වමට විතැන් වීම**

සමතුලිතතාවයට වන බලපෑම: සැපයුම් වක්‍රය වමට විතැන් වූ විට (නිෂ්පාදන පිරිවැය ඉහළ යාම හෝ සැපයුම අඩුවීම නිසා), වෙළඳපොළ සමතුලිත මිල ඉහළ යන අතර සමතුලිත ප්‍රමාණය පහළ යයි.

පාරිභෝගික අතිරික්තය (Consumer Surplus): භාණ්ඩයේ මිල ඉහළ යාම සහ වෙළඳපොළේ මිලදී ගත හැකි ප්‍රමාණය අඩු වීම නිසා පාරිභෝගික අතිරික්තය සැලකිය යුතු ලෙස පහළ යයි (අඩු වේ).

නිෂ්පාදන අතිරික්තය (Producer Surplus): මිල ඉහළ ගියද, අලෙවි කරන සමස්ත භාණ්ඩ ප්‍රමාණය අඩු වීම සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යාම නිසා අවසාන ප්‍රතිඵලය ලෙස නිෂ්පාදන අතිරික්තය ද පහළ යයි (අඩු වේ).

Q3)

**I.**මෙහිදී ජලය සඳහා අනිවාර්ය සැපයීමක් සහිත වන අතර රජය විසින් සමතුලිත මිලට පහලින් උපරිම මිලක් පනවා ලබා දේ.
එලෙස පැනවීමෙන් සඳහා අනිවාර්ය සැපයීමක් පවතින බැවින් සැපයීමේ වෙනසක් හට නොගනී අතර, උපරිම මිල මඟින් පාරිභෝගිකයා ගෙවිය යුතු මිල අඩු කරයි.
එයට පෙරට වඩා වැඩි ප්‍රමාණයක් පාරිභෝගිකයා ඉල්ලුම් කරන නිසා අතිරේක ඉල්ලුමක් හට ගනී.
එලෙස හටගැනෙන අතිරේක ඉල්ලුම කළමනාකරනය කිරීමට සැපයීම ප්‍රමාණවත් නොවන අතර කළු කඩ මිලක් ඇති වීමට ඉඩ ඇත.
තවද නිෂ්පාදකයාට ලැබෙන මිල අඩු වන නිසා නිෂ්පාදක අතිරේකයද පහළ යයි.
මෙහිදී සැපයීම සඳහා අනිවාර්ය වන බැවින්, සමතුලිත ප්‍රමාණය වෙනසක් ඇති නොවන නිසා, සුභසාධනයේ පාඩුවක් ඇති නොවේ.
නමුත් පෝලිම් ගැසීම වැනි කිසිදු නිසා වෙනත් සම්පත් නාස්තිවීමට ඉඩ ඇත.

II.බද්ද නිසා භාණ්ඩයේ මිල ඉහළ යන අතර විකිණෙන ප්‍රමාණය අඩු වේ. මෙහිදී පාරිභෝගික සහ නිෂ්පාදක අතිරික්තයන්ගෙන් කොටසක් රජයේ බදු ආදායම බවට පත් වන අතර, තවත් කොටසක් කිසිවෙකුටත් නොලැබී අහිමි වී යයි. මෙම සමාජ සුභසාධන හානිය අධි බදු බර (Deadweight Loss) ලෙස හැඳින්වේ

පූර්ණ අනම්‍ය ඉල්ලුමේදී පාරිභෝගිකයාට
පූර්ණ අනම්‍ය සැපයුමේදී නිෂ්පාදකයාට

III.

a. $Qd = 800 - 4P$

$Ed = 1000 - 8P$

$Ed = Qd - Qs$

$Qs = Qd - Ed$

$= (800 - 4P) - (1000 - 8P)$

$= -200 + 4P$

සමතුලිතතාවය:

| | |
|---|---|
| $Qd = Qs$ | $Qd = 800 - 4P$ |
| $800 - 4P = -200 + 4P$ | $= 800 - 4(125)$ |
| $1000 = 8P$ | $= 300$ |
| $P = 125$ | |

සමතුලිත මිල = රු. 125 | සමතුලිත ප්‍රමාණය = ඒකක 300

b. සහනාධාරයෙන් පසු සමතුලිතය

$Qs = -200 + 4(P + 10)$

$Qs = -200 + 4P + 40$

$Qs = -160 + 4P$

$Qd = Qs$

$800 - 4P = -160 + 4P$

$960 = 8P$

$P = 120$

$Qd = 800 - 4P$

$Qd = 800 - 4 \times 120$

$Qd = 320$

නව සමතුලිත මිල = රු. 120

නව සමතුලිත ප්‍රමාණය = 320

පාරිභෝගිකයා ගෙවන මිල = රු. 120
නිෂ්පාදකයා ලබන මිල = 130 (120 + 10)
පාරිභෝගිකයාට ලද සහනාධාරය
= පාරිභෝගික ගෙවන මිල - පෙර මිල
= 125 - 120
= රු. 5
නිෂ්පාදකයාට ලද සහනාධාරය
= නව නිෂ්පාදක මිල - පැරණි මිල
= 130 - 125
= රු. 5

c. =සහනාධාරය × නව සමතුලිත ප්‍රමාණය
$=10 \times 320$
=රු. 3,200/-

d. $=(1/2) \times 10 \times (320-300)$
$=5 \times 20$
=රු. 100/-

IV.කෘෂිකාර්මික භාණ්ඩවල සැපයුම කාලගුණය, දේශගුණය වැනි බාහිර සාධක මත දැඩි ලෙස රඳා පවතින බැවින් ඒවායේ සැපයුම සහ මිල නිරන්තරයෙන් උච්චාවචනය වේ. මෙය පාලනය කරමින් නිෂ්පාදකයාත් පාරිභෝගිකයාත් දෙපාර්ශ්වයම ආරක්ෂා කිරීමට රජය ස්වාරක්ෂක තොග ක්‍රමය ක්‍රියාත්මක කරයි.
උදා:- වී අලෙවි මණ්ඩලය මගින් රජය වී මිලදී ගැනීම.
අස්වැන්න බහුල කාලවලදී (සහතික මිලක් පවත්වා ගැනීම).
යම් කන්නයකදී අධික අස්වැන්නක් ලැබුණු විට, වෙළඳපොළට විශාල සැපයුමක් එකවර පැමිණේ. මෙවිට භාණ්ඩවල මිල ගොවියාට අලාභ සිදුවන මට්ටමකට පහත වැටිය හැක. මෙය වළක්වා ගැනීමට රජය විසින් වෙළඳපොළ මිලට වඩා ඉහළින් අවම සහතික මිලක් නියම කර, වෙළඳපොළේ ඇති අතිරික්ත සැපයුම රජයේ නියෝජිත ආයතන හරහා මිලදී ගෙන ගබඩා කරනු ලබයි.

අස්වැන්න අඩු කාලවලදී / හිඟ කාලවලදී (උපරිම මිලක් පවත්වා ගැනීම):
නියඟයක් හෝ වෙනත් හේතුවක් නිසා අස්වැන්න අඩු වූ විට භාණ්ඩ හිඟයක් ඇතිවී මිල අධික ලෙස ඉහළ යයි. මෙය පාරිභෝගිකයාට දැඩි ලෙස පීඩා ගෙන දෙන්නකි. මෙවැනි අවස්ථාවලදී රජය විසින් අස්වැන්න බහුල කාලයේ ගබඩා කරගත් තොග

වෙළඳපොළට නිකුත් කරනු ලැබේ. එමඟින් වෙළඳපොළ සැපයුම වැඩි වී මිල යම් මට්ටමකින් පහළ යන අතර, පාරිභෝගිකයා ආරක්ෂා කිරීමට සාධාරණ උපරිම මිලක් යටතේ භාණ්ඩ අලෙවි කිරීමට රජයට හැකිවේ.

Q4)

Question No.4

I.කෙටි කාලයේදී සමහර නිෂ්පාදන සාධක ස්ථාවර වේ.
විචල්‍ය සාධක වැඩි කළ විට අඩුවන ආන්තික ඵල නීතිය ක්‍රියාත්මක වේ.
එක් එක් අමතර සේවකයාගෙන් බෙන අතිරේක නිමැවුම අඩුවේ.
එබැවින් අමතර නිමැවුම් ඒකකයක් නිෂ්පාදනය කිරීමේ පිරිවැය ඉහළ යාමෙන් ආන්තික පිරිවැය වැඩිවේ.

II.භාණ්ඩ සමජාතීය (Homogeneous) වේ.
තනි ආයතනයකට මිල පාලනය කළ නොහැක.
ගැනුම්කරුවන් හා විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටී.
ප්‍රචාරණ වියදම් දැරුවද සැලකිය යුතු අමතර ඉල්ලුමක් ලබාගැනීම අපහසුය.

III.විශාල ආයතනයක් කුඩා ආයතන කිහිපයකට බෙදීමෙන් පරිමාණ ආර්ථික වාසි අහිමි වේ.
විදුලි සැපයුම සාමාන්‍යයෙන් පරිමාණ ආර්ථික (Economies of Scale) ලක්ෂණ දක්වයි.
ඒ හේතුවෙන් සාමාන්‍ය මුළු පිරිවැය (ATC) ඉහළ යා හැක.
දිගුකාලීනව පාරිභෝගිකයා ගෙවන මිලද ඉහළ යා හැක.

IV.තේ දලු නෙලීම සඳහා විකල්ප රැකියා අවස්ථා බොහෝ විට පවතී.
එබැවින් ශ්‍රමිකයා රැකියාවේ තබා ගැනීමට අවශ්‍ය අවම ආදායම සංක්‍රාම ඉපයීම ලෙස සැලකේ.
එම නිසා ආදායමේ වැඩි කොටස සංක්‍රාම ඉපයීම වේ.
ආර්ථික බදු කුලිය සාපේක්ෂව කුඩා කොටසක් පමණි.




V.කතිපයාධිකාරී වෙළෙඳපොළ බලය හිමිකරගෙන සිටී.
පාරිභෝගික කණ්ඩායම්වල ඉල්ලුම් ප්‍රත්‍යාස්ථතාව වෙනස් වේ.
නැවත විකිණීම (resale) සීමා කළ හැක.

ලාභය උපරිම කිරීම සඳහා විවිධ පාරිභෝගිකයන්ගෙන් විවිධ මිල ගණන් අය කරයි.

Q5)

i.

a. පිළිතුර: අසත්‍යයි.
හේතුව: ජාතික ගිණුම්කරණයේදී පුද්ගලයෙකු වසරකට වඩා වැඩි කාලයක් විදේශගතව සිටී නම්, ඔහුගේ ආර්ථික ක්‍රියාකාරකම් සිදුවන්නේ එම විදේශ රට තුළ බැවින් ඔහු අදාළ මව් රටට සාපේක්ෂව 'අනිවාසිකයෙකු' (Non-resident) ලෙස සැලකේ.

b. පිළිතුර: සත්‍යයි.
හේතුව: දළ එකතු කළ අගය (Gross Value Added) යනු නිෂ්පාදනයේ වටිනාකමෙන් අතරමැදි යෙදවුම් (Intermediate Consumption) ඉවත් කළ පසු ලැබෙන අගයයි. මෙම ඉතිරි වන අගය බෙදී යන්නේ නිෂ්පාදනයට දායක වූ ප්‍රාථමික යෙදවුම් (ඉඩම්, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය) සඳහා ගෙවීම් (බදු, කුලී, වැටුප්, පොලී, ලාභ) වශයෙනි. එබැවින් ප්‍රාථමික යෙදවුම් වල වටිනාකම සහ දළ එකතු කළ අගය සමාන වේ.

c. පිළිතුර: අසත්‍යයි.
හේතුව: ජාතික ගිණුම්කරණයේදී ගණනය කරනු ලබන්නේ වර්තමාන කාල පරිච්ඡේදය තුළ සිදුවූ අලුත් නිෂ්පාදනයන් පමණි. තමා සතු පාවිච්චි කළ මෝටර් රථයක් විකිණීම (Second-hand sales) යනු පෙර වර්ෂයක නිෂ්පාදනය කළ වත්කමක අයිතිය හුවමාරු වීමක් පමණක් මිස නව නිෂ්පාදනයක් නොවේ. එබැවින් එය නිෂ්පාදන ගිණුමට හෝ ජාතික ආදායමට ඇතුළත් නොවේ.

d. පිළිතුර: සත්‍යයි.
හේතුව: භාණ්ඩ හා සේවා ඇගයීමේ මිල ක්‍රම අනුව, මූලික මිල (Basic Price) තුළ නිෂ්පාදිතය මත බදු ඇතුළත් නොවේ (නිෂ්පාදන මත බදු පමණක් ඇතුළත් විය හැක). මූලික මිලට 'නිෂ්පාදිතය මත ශුද්ධ බදු' එකතු කළ විට ගැනුම්කරුවන්ගේ මිල (Purchasers' Price) ලැබේ. එබැවින් නිෂ්පාදිතය මත බදු ඇතුළත් වන්නේ ගැනුම්කරු ගෙවන මිල තුළ පමණි.

II.

1. මූලික මිලට එකතු කළ අගය = 1,370 + 80 + 60 + 80 + 90 + (60 - 20)
මූලික මිලට එකතු කළ අගය = 1,680 + 40 = 1,720

2. දළ දේශීය නිෂ්පාදිතය (GDP) = 1,720 + (300 - 200) + 320
දළ දේශීය නිෂ්පාදිතය (GDP) = 1,720 + 100 + 320 = 2,140

3.වැය කළ හැකි දළ ජාතික ආදායම = 2,140 + 110 + 250 = 2,500

III. සමතුලිත ජාතික ආදායම රු. බිලියන 50 කින් වැඩි වේ

IV.

1. Y = C + I + G + Nx
Y = 250 + 0.8( Y- 40 + 50) + 200 + 150 - 100
= 500+ 0.8(Y + 10)
=500 + 0.8Y + 8
Y = 508 + 0.8Y
Y - 0.8Y = 508
0.2Y/ 0.2 = 508/0.2
Y = 2540

2. Yd = Y - Tx + Tr
= 2540 - 40 - 50
=2550
S = -250 + 0.2 Yd
= -250 + 0.2(Y-40+ 50)
=-250 + 0.2(2550)
=260

3. ΔY = ΔI x Ki
40 = ΔI x 1/0.2
ΔI = -40/5
ΔI = -8

Q6)

I.පොලී අනුපාතිකය සහ මුදල් ඉල්ලුම (විශේෂයෙන්ම සමපේක්ෂණ මුදල් ඉල්ලුම) අතර පවතින්නේ ප්‍රතිලෝම (සෘණ) සම්බන්ධතාවයකි. එනම්, පොලී අනුපාතික ඉහළ යනවිට මුදල් ඉල්ලුම පහළ යන අතර, පොලී අනුපාතික පහළ යනවිට මුදල් ඉල්ලුම ඉහළ යයි. මෙයට ප්‍රධාන හේතු 2කි:

### ආවස්ථික පිරිවැය

මුදල් ළඟ තබා ගැනීමෙන් (භෞතික මුදල් හෝ ජංගම ගිණුම්වල) කිසිදු පොලී ආදායමක් නොලැබේ. පොලී අනුපාතික ඉහළ මට්ටමක පවතින විට, මුදල් ළඟ තබා ගැනීමේ අවස්ථා පිරිවැය ඉහළ යයි. එම නිසා මිනිසුන් මුදල් වශයෙන් ළඟ තබා ගන්නා ප්‍රමාණය අඩු කර, ඒවා පොලී උපයන බැංකු තැන්පතු හෝ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමට පෙළඹේ. ප්‍රතිඵලයක් ලෙස මුදල් ඉල්ලුම අඩු වේ.

### සමපේක්ෂණ චේතනාව සහ සුරැකුම්පත් (බැඳුම්කර) මිල

පොලී අනුපාතික සහ බැඳුම්කර මිල අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවතී. පොලී අනුපාතික ඉතා ඉහළ අගයක් ගන්නා විට, බැඳුම්කර මිල ගණන් ඉතා අවම මට්ටමක පවතී. මෙවැනි අවස්ථාවක අනාගතයේදී පොලී අනුපාතික පහත වැටී බැඳුම්කර මිල ඉහළ යනු ඇතැයි (ප්‍රාග්ධන ලාභ ලැබිය හැකි යැයි) අපේක්ෂාවෙන් මිනිසුන් තමන් සතු මුදල් බැඳුම්කර මිලදී ගැනීමට යොදවයි. එම නිසා මුදල් සඳහා වන සමපේක්ෂණ ඉල්ලුම අවම වේ.

II.මහජනතාව සතුව මුදල් රඳවා තබා ගැනීම (Currency Drain / Cash Leakage): ණය ලබන්නන් හෝ සාමාන්‍ය මහජනතාව තමන්ට ලැබෙන සියලුම මුදල් නැවත බැංකුවල තැන්පත් නොකර, දෛනික අවශ්‍යතා සඳහා යම් ප්‍රතිශතයක් භෞතික මුදල් (Cash) ලෙස ළඟ තබා ගැනීම.

බැංකු සතුව අතිරික්ත සංචිත පවත්වාගෙන යාම (Excess Reserves): වාණිජ බැංකු තමන් සතු උපරිම අතිරික්ත සංචිත ප්‍රමාණයම ණය ලෙස ලබා නොදී, අවදානම් කළමනාකරණය හෝ ද්‍රවශීලතාවය රැකගැනීම සඳහා අතිරික්ත සංචිත ප්‍රමාණයක් (Excess Reserves) බැංකුව තුළම රඳවා තබා ගැනීම.

ණය ඉල්ලුම අඩු වීම: ආර්ථිකයේ පවතින අවපාත තත්ත්වයන් නිසා හෝ ඉහළ පොලී අනුපාතික නිසා ව්‍යාපාරිකයන් සහ මහජනතාව බැංකුවලින් ණය ගැනීමට දක්වන උනන්දුව අඩු වීම.

III.(අ)බැංකු පද්ධතිය සතු රු. බිලියන 50 ක අතිරික්ත සංචිතය සම්පූර්ණයෙන්ම යොදාගෙන උපරිම ණය මැවීම සිදු කළ විට:

නව තැන්පතු ප්‍රසාරණය = {අතිරික්ත සංචිතය}/ {ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය}
= {50}/{0.10} =රු. බිලියන 500
නව ණය ප්‍රමාණය = නව තැන්පතු - අතිරික්ත සංචිතය = 500 - 50 = රු. බි.450

| වත්කම් (Assets) | රු. බිලියන | වගකීම් (Liabilities) | රු. බිලියන |
|---|---|---|---|
| සංචිත (Reserves)<br>*(මූලික 300)* | 300 | ජංගම තැන්පතු (Demand Deposits)<br>*(මුල් 2500 + නව 500)* | 3,000 |
| ණය (Loans)<br>*(නව ණය මැවීම)* | 2,700 | | |
| **සමස්ත වත්කම්** | **3,000** | **සමස්ත වගකීම්** | **3,000** |

(ආ) නව පටු මුදල් සැපයුම = රු. බිලියන 4,000

IV.මෙම ප්‍රකාශය සම්පූර්ණයෙන්ම සත්‍ය වේ.
ආර්ථිකයක මූලික මුදල් (Monetary Base / High-powered Money) නිකුත් කිරීමේ ඒකාධිකාරී බලය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වුවද, සමස්ත මුදල් සැපයුම තීරණය වන්නේ මහ බැංකුවේ ක්‍රියාමාර්ග මත පමණක් නොවේ. මුදල් සැපයුම කෙරෙහි මහ බැංකුවට සෘජුවම පාලනය කළ නොහැකි, ආර්ථිකයේ අනෙකුත් පාර්ශවයන්ගේ හැසිරීම් මත තීරණය වන සාධක 2ක් බලපායි.

වාණිජ බැංකු වල හැසිරීම (Behavior of Commercial Banks)
මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස් කළද, වාණිජ බැංකු තමන් සතු අතිරික්ත සංචිත ප්‍රමාණයෙන් කොපමණ ප්‍රමාණයක් ණය ලෙස ලබා දෙන්නේද යන්න තීරණය කරන්නේ ඔවුන් විසින්මය. බැංකු විසින් වැඩි අතිරික්ත සංචිත ප්‍රමාණයක් (Excess Reserves) රඳවා තබා ගැනීමට තීරණය කළහොත් මුදල් සැපයුම බලාපොරොත්තු වන තරම් වැඩි නොවේ.

මහජනතාවගේ හැසිරීම (Behavior of the Public)
මහජනතාව තමන් සතු ධනයෙන් කොපමණ ප්‍රතිශතයක් භෞතික ව්‍යවහාර මුදල් (Cash) ලෙස ළඟ තබා ගන්නේද සහ කොපමණ ප්‍රමාණයක් බැංකු තැන්පතු (Deposits) ලෙස තබන්නේද යන්න තීරණය කරන්නේ ඔවුන්ගේ කැමැත්ත මතය (Currency-Deposit Ratio). මහජනයා බැංකු ක්‍රමය ප්‍රතික්ෂේප කර මුදල් අතැතිව තබා ගැනීමට පෙළඹුණහොත්, බැංකු පද්ධතියේ ණය මැවීමේ ක්‍රියාවලිය අඩාල වී මුදල් සැපයුම පහත වැටේ. මෙය මහ බැංකුවට සෘජුව පාලනය කළ නොහැක

Q7)

I.ශුද්ධ පොදු භාණ්ඩයක් (Pure Public Good) යනු:
ප්‍රධාන ලක්ෂණ දෙකකින් සමන්විත වන භාණ්ඩ හෝ සේවාවන්ය:

පරිභෝජනයේ දී නිර්වාදිත බව (Non-rivalry): එක් පුද්ගලයෙකු විසින් භාණ්ඩය පරිභෝජනය කිරීම නිසා තවත් අයෙකුට එය පරිභෝජනය කිරීමට ඇති අවස්ථාව හෝ ප්‍රමාණය අඩු නොවීම.

බැහැර කළ නොහැකි බව (Non-excludability): මිලක් නොගෙවන පුද්ගලයන්ව එම භාණ්ඩයේ ප්‍රයෝජන ලැබීමෙන් වැළැක්වීමට හෝ බැහැර කිරීමට තාක්ෂණිකව හෝ ප්‍රායෝගිකව නොහැකි වීම (උදාහරණ: ජාතික ආරක්ෂාව, වීදි ලාම්පු).

වෙළෙඳපොළ අසමත් වීමට හේතු:

නොමිලේ ප්‍රයෝජන ලබන්නන්ගේ ගැටලුව (Free Rider Problem): භාණ්ඩයේ පවතින "බැහැර කළ නොහැකි" ලක්ෂණය නිසා, මිල නොගෙවන අයටද එහි ප්‍රතිලාභ සමසේ ලැබේ. මේ නිසා පාරිභෝගිකයන් ඒ සඳහා ස්වේච්ඡාවෙන් මිලක් ගෙවීමට ඉදිරිපත් නොවේ.

ලාභ නොලැබීම: පාරිභෝගිකයන් මිලක් නොගෙවන විට පුද්ගලික අංශයේ ව්‍යවසායකයින්ට පිරිවැය පියවා ගැනීමට හෝ ලාභ ලැබීමට නොහැකි වේ.

සැපයුම බිඳ වැටීම: මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක නොවන බැවින් පුද්ගලික වෙළෙඳපොළ මඟින් මෙම භාණ්ඩ अजित් සැපයීමක් සිදු නොකරයි (Zero Supply). එම නිසා සම්පත් කාර්යක්ෂමව බෙදා හැරීමට අපොහොසත් වෙමින් වෙළෙඳපොළ සම්පූර්ණයෙන්ම අසමත් වේ.

ii.

ප්‍රාථමික ශේෂය (Primary Balance) යනු:රජයේ සමස්ත අයවැය හිඟයෙන් (නැතහොත් සමස්ත ආදායම සහ සමස්ත වියදම අතර වෙනසෙන්), අතීතයේ ලබාගත් ණය වෙනුවෙන් ගෙවීමට ඇති පොලී පියවීම් (Interest Payments) ඉවත් කළ පසු ලැබෙන ශේෂයයි
ප්‍රාථමික ශේෂය = සමස්ත රාජ්‍ය ආදායම- පොලී වියදම් හැර සමස්ත රාජ්‍ය වියදම
ණය තිරසාරභාවය මැනීමට යොදාගන්නා ආකාරය:
ප්‍රාථමික ශේෂය මඟින් පෙන්වන්නේ වත්මන් වර්ෂයේ රජයේ දෛනික පාලන කටයුතු සහ සංවර්ධන කටයුතු (අතීත ණය බරින් තොරව) තමන්ගේම ආදායමෙන් කළමනාකරණය කර ගැනීමට රජය සමත්ව තිබේද යන්නයි.

ප්‍රාථමික අතිරික්තයක් (Primary Surplus) පැවතීම: රජයේ වත්මන් ආදායම වත්මන් වියදම්වලට වඩා වැඩි බවයි. මෙවැනි විටෙක රජයට අතීත ණයවල පොලී හෝ වාරික ගෙවීම සඳහා අලුතින් ණය ගැනීමට සිදු නොවේ (හෝ ගන්නා ණය ප්‍රමාණය අඩු වේ). මෙය ණය තිරසාරභාවය ධනාත්මක මට්ටමක පවතින බවටත්, දිගුකාලීනව දදේනි (GDP) අනුපාතයට සාපේක්ෂව ණය බර අඩු වන බවටත් දර්ශකයකි.

ප්‍රාථමික හිඟයක් (Primary Deficit) පැවතීම: රජයට සිය දෛනික වියදම් පියවා ගැනීමට මෙන්ම පරණ ණයේ පොලී ගෙවීමට පවා අලුතින්ම ණය ගැනීමට (Debt compounding) සිදු වන බවයි. මෙය ණය තිරසාර නොවන (Unsustainable) භයානක තත්ත්වයක් බව පෙන්වයි.

iii.

ණය තිරසාරභාවය (Debt Sustainability) යනු:

රජයක් විසින් ලබාගෙන ඇති දේශීය හා විදේශීය ණය සහ ඒ සඳහා වන පොලී වාරික, රටේ ආර්ථික වර්ධනයට බාධාවක් නොවන පරිදි, අතිරේක ණය සහන හෝ පැහැර හැරීම්වලින් තොරව, අනාගතයේදීත් ක්‍රමවත්ව ගෙවා නිම කිරීමට රජයට පවතින මූල්‍යමය හැකියාවයි.

ශ්‍රී ලංකාවේ ණය තිරසාරභාවයේ වත්මන් මට්ටම:

වත්මන් වන විට ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය තත්ත්වය "තිරසාර නොවන මට්ටමක" පවතී.

ශ්‍රී ලංකාව නිල වශයෙන් සිය විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය (Debt Restructuring) සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සහ ද්විපාර්ශ්වික/බහුපාර්ශ්වික ණයහිමියන් සමඟ සාකච්ඡා කරමින්, ණය තිරසාර මට්ටමකට (Debt Sustainability) නැවත ළඟා වීමට දැඩි ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක නිරත වෙමින් සිටියි.

iv.

1. ( 15000+2000)-1900=1600
2. (1500+2000+1000)-(1900+3000)=-400
3. -400+100=-300
4. 4000+300=4300

Q8)

i.

කිසියම් රටකට අනෙක් රටකට වඩා අඩු සම්පත් ප්‍රමාණයක් යොදා ගනිමින් භාණ්ඩයක් නිෂ්පාදනය කළ හැකි නම්, එම රටට ඒ සඳහා නිරපේක්ෂ වාසියක් ඇත.

නමුත් වෙළඳාම තීරණය වන්නේ නිරපේක්ෂ වාසිය මත නොව සංසන්දනාත්මක වාසිය (ආවස්ථික පිරිවැය) මතයි. රටකට භාණ්ඩ දෙකම සඳහාම නිරපේක්ෂ වාසිය නොමැති වුවද, යම් එක් භාණ්ඩයක ආවස්ථික පිරිවැය අනෙක් රටට වඩා අඩු නම්, එම භාණ්ඩය නිෂ්පාදනය සඳහා සංසන්දනාත්මක වාසියක් හිමි වේ.

* උදා: A සහ B ලෙස රටවල් දෙකක් සහ තිරිඟු හා රෙදි ලෙස භාණ්ඩ දෙකක් ඇත. පහත දැක්වෙන්නේ එක් ශ්‍රම ඒකකයකින් නිපදවිය හැකි ප්‍රමාණයන්ය:

* A රට: තිරිඟු ඒකක 10 ක් හෝ රෙදි ඒකක 10 ක්

* B රට: තිරිඟු ඒකක 5 ක් හෝ රෙදි ඒකක 2 ක්

* නිරපේක්ෂ වාසිය:

* A රටට තිරිඟු (10 > 5) සහ රෙදි (10 > 2) යන දෙකම නිපදවීම සඳහා නිරපේක්ෂ වාසියක් ඇත.

* B රටට කිසිදු නිරපේක්ෂ වාසියක් නැත.

* සාපේක්ෂ වාසිය (ආවස්ථික පිරිවැය):

* A රටේ 1 තිරිඟු ඒකකයක ආවස්ථික පිරිවැය = රෙදි 1 කි (10/10).

* B රටේ 1 තිරිඟු ඒකකයක ඒකකයක ආවස්ථික පිරිවැය = රෙදි 0.4 කි (2/5).

* B රටේ තිරිඟු නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය (0.4)

A රටට (1) වඩා අඩු බැවින්, නිරපේක්ෂ වාසි නොමැති වුවද B රටට තිරිඟු නිෂ්පාදනය සඳහා සංසන්දනාත්මක වාසියක් ඇත.

ii. තරඟකාරී වාසිය (Competitive Advantage)

තරඟකාරී වාසිය යනු ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තම තරඟකරුවන්ට වඩා සාර්ථක වීමට, වැඩි වටිනාකමක් නිර්මාණය කිරීමට හෝ වෙළඳපොළ කොටසක් අත්පත් කර ගැනීමට ආයතනයකට හෝ රාජ්‍යයකට ඇති සුවිශේෂී හැකියාවයි. මෙය හුදෙක් ස්වාභාවික සම්පත් මත පදනම් නොවේ, නවෝත්පාදනය සහ කාර්යක්ෂමතාව මත ගොඩනැගේ.

තරඟකාරී වාසි හට ගන්නා මූලාශ්‍ර:

* පිරිවැය නායකත්වය (Cost Leadership): තාක්ෂණය හෝ පරිමාණය පාවිච්චි කරමින් තරඟකරුවන්ට වඩා අඩු පිරිවැයකට නිෂ්පාදනය කිරීම.

* විවිධාංගීකරණය (Differentiation): උසස් තත්ත්වය, සන්නාම අනන්‍යතාවය හෝ සුවිශේෂී ලක්ෂණ මඟින් පාරිභෝගිකයින්ට වැඩි වටිනාකමක් ලබා දීම.

* නවෝත්පාදනය සහ තාක්ෂණය (Innovation & Technology): නවීන පර්යේෂණ හා සංවර්ධන (R&D) ක්‍රියාවලි.

* මානව ප්‍රාග්ධනය (Human Capital): ඉහළ කුසලතා සහ දැනුම සහිත ශ්‍රම බලකායක් සිටීම.

iii. විදේශ විනිමය අනුපාතය අවප්‍රමාණය වීම සහ වෙළඳ ශේෂය

* විදේශ විනිමය අනුපාතය අවප්‍රමාණය වීම (Depreciation) යනු දේශීය මුදල් ඒකකයේ අගය විදේශ මුදල්වලට සාපේක්ෂව පහළ යාමයි (උදාහරණයක් ලෙස, ඩොලරයකට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය ඉහළ යාම). මෙය වෙළඳ ශේෂයේ හිඟය අඩු කිරීමට ප්‍රධාන ආකාර දෙකකින් දායක වේ:

* අපනයන තරඟකාරිත්වය ඉහළ යාම: දේශීය මුදල අවප්‍රමාණය වූ විට, විදේශිකයන්ට අපේ රටේ භාණ්ඩ මිලදී ගැනීම ලාභදායී වේ. මේ නිසා ජාත්‍යන්තර වෙළඳපොළේ අපනයන ඉල්ලුම ඉහළ ගොස් අපනයන ආදායම වැඩි වේ.

* ආනයන අධෛර්යමත් වීම: විදේශ විනිමය මිල ඉහළ යන බැවින්, ආනයනික භාණ්ඩ සඳහා දේශීය පාරිභෝගිකයින්ට වැඩි මිලක් ගෙවීමට සිදු වේ. මේ හේතුවෙන් ආනයන ඉල්ලුම අඩු වී, ආනයන වියදම් පහළ යයි.

iv.

අ) ගෙවුම් ශේෂ (BOP) මූලධර්මයට අනුව, විදේශ විනිමය රට තුළට ඒම බැර (+)ලෙසත්, රටින් බැහැරට යාම හෝ අත්හැරීම් හර (-) ලෙසත් සටහන් වේ.

i. ඇඟලුම් අපනයනය (මිලියන 200):

* මෙය භාණ්ඩ අපනයනයක් බැවින් විදේශ විනිමය රටට ලැබේ.

* ජංගම ගිණුම / වෙළඳ ගිණුම - බැර (Credit)

ii. ඛනිජ තෙල් ආනයනය (මිලියන 400):

* මෙය භාණ්ඩ ආනයනයක් බැවින් විදේශ විනිමය රටින් පිටවේ.

* ජංගම ගිණුම / වෙළඳ ගිණුම - හර (Debit)

iii. ණය පොලී ගෙවීම (මිලියන 250):

* විදේශීය ප්‍රාග්ධනය පාවිච්චි කිරීම වෙනුවෙන් කරන ආයෝජන ආදායම් ගෙවීමකි.

* ප්‍රාථමික ආදායම් ගිණුම - හර (Debit)

ආ)

වෙළඳ ගිණුමේ ශේෂය = 12000 - 18000 = -6000

සේවා ගිණුමේ ශේෂය = 3000 - 1500 = +1500

ප්‍රාථමික ආදායම් ශේෂය = 500 - 2500 = -2000

ද්විතීයික ආදායම් ශේෂය = 6000 - 500 = +5500

ශුද්ධ වැරදීම් හා අත්හැරීම් = 200 - 400 = -200

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

i. ජංගම ගිණුමේ ශේෂය

= -6000 + 1500 + (-2000) + 5500

= -1000 (හිඟයකි)

ii. ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

= 50 - 100

= -50 (හිඟයකි)

iii. මූල්‍ය ගිණුමේ ශේෂය (Financial Account Balance):

ජංගම ගිණුමේ ශේෂය + ප්‍රාග්ධන ගිණුමේ ශේෂය + ශුද්ධ වැරදීම් හා අත්හැරීම් = මූල්‍ය ගිණුමේ ශේෂය

-1000 + (-50) + (-200) = -1250 (හිඟයකි)

Q9)

i.

ආර්ථික වර්ධනය සහ ආදායම් බෙදියාමේ සමානත්වය අතර ගැටුම

රටක දිගුකාලීන නිෂ්පාදන ධාරිතාව (GDP) වැඩි කිරීමට නම් නව කර්මාන්තශාලා, යන්ත්‍ර සූත්‍ර, යටිතල පහසුකම් සහ තාක්ෂණය (ප්‍රාග්ධනය) ගොඩනැගිය යුතුය. මීට අවශ්‍ය මුදල් සපයා ගැනීමට නම් රට තුළ ඉහළ "දේශීය ඉතුරුම්" (Savings) මට්ටමක් තිබිය යුතුය.

ඒ අනුව, රටේ ධනය ඉතුරුම් කළ හැකි ධනවත් පන්තිය අතේ කේන්ද්‍රගත වීමට ඉඩ හැරීමෙන් ආර්ථික වර්ධනය වේගවත් වන නමුත්, එහි ඍජු ප්‍රතිඵලයක් ලෙස ආදායම් බෙදීයාමේ අසමානතාවය දැඩි ලෙස ඉහළ යයි.

ආර්ථික වර්ධනය සහ පාරිසරික තිරසාරභාවය අතර ගැටුම (Growth vs. Environmental Sustainability):

දළ දේශීය නිෂ්පාදිතය (GDP) වේගයෙන් වැඩි කිරීමට නම් මහා පරිමාණ කාර්මිකකරණය, නාගරීකරණය සහ ස්වභාවික සම්පත් අධි-පරිභෝජනය සිදු කිරීමට සිදු වේ.

මෙහි ප්‍රතිඵලයක් ලෙස පරිසර දූෂණය, වනාන්තර විනාශය සහ සම්පත් ක්ෂය වීම සිදු වන අතර, එය දිගුකාලීන පාරිසරික තිරසාරභාවය නමැති සංවර්ධන අරමුණ සමඟ ඍජුවම ගැටේ.

පූර්ණ රැකියා නියුක්තිය සහ මිල ස්ථායිතාව අතර ගැටුම (Full Employment vs. Price Stability):

විරැකියාව අවම කරමින් පූර්ණ රැකියා නියුක්තිය ළඟා කර ගැනීමට රජය සමස්ත ඉල්ලුම උත්තේජනය කරන විට, ශ්‍රම වෙළෙඳපොළේ ඉල්ලුම වැඩි වී වැටුප් සහ පිරිවැය ඉහළ යයි.

මෙහි ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ හා සේවා මිල මට්ටම ඉහළ ගොස් උද්ධමනයක් නිර්මාණය වේ.

ii.

ආදායම් දරිද්‍රතාවය (Income Poverty):

පුද්ගලයෙකුට හෝ පවුලකට තම මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන අවම ආදායම් මට්ටම හෝ පරිභෝජන වියදම ලබා කර ගැනීමට නොහැකි වීමයි.

බහුමාන දරිද්‍රතාවය (Multidimensional Poverty):

පුද්ගලයෙකු හෝ පවුලක් හුදෙක් ආදායම් හිඟකමට පමණක් නොව, ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදී මූලික අවශ්‍යතා ගණනාවක් එකවර අහිමි වීම්වලට (Multiple Deprivations) ලක්වීමේ තත්ත්වයයි.

මෙයින් මුදල්වලින් පමණක් මැනිය නොහැකි, මානව ජීවිතයේ පවතින සැබෑ දරිද්‍රතාවයේ ස්වභාවය නිරූපණය වේ.

බහුමාන දරිද්‍රතා දර්ශකය (MPI) මඟින් ප්‍රධාන මානයන් 3ක් සහ ඒ යටතේ පවතින දර්ශක 10ක් ඔස්සේ ජනතාවගේ අහිමිවීම් මැන බලයි:

1. සෞඛ්‍යය (Health): (පෝෂණය සහ ළමා මරණ අනුපාතිකය යන දර්ශක)

2. අධ්‍යාපනය (Education): (පාසල් ගිය වර්ෂ ගණන සහ පාසල් පැමිණීම යන දර්ශක)

3. ජීවන තත්ත්වය (Standard of Living): (Cooking Oil, සනීපාරක්ෂාව, පිරිසිදු පානීය ජලය, විදුලිය, නිවාස තත්ත්වය සහ වත්කම් යන දර්ශක)

ආර්ථික සංවර්ධනය ළඟා කර ගැනීමෙහිලා බහුමාන දරිද්‍රතාවය තුරන් කිරීම වඩා වැදගත් වීමට හේතු

- සැබෑ මානව සංවර්ධනය සහ ජීවන තත්ත්වය නිරූපණය කිරීම
- දේශීය මානව ප්‍රාග්ධනය වර්ධනය වීම (Human Capital Development)
- දරිද්‍රතාවයේ ස්වභාවය සහ තීව්‍රතාවය නිවැරදිව හඳුනාගත හැකි වීම
- ඵලදායී සහ ඉලක්කගත රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය (Targeted Policy Making)

iii.

| බලපෑම් ක්ෂේත්‍රය | පුහුණු ශ්‍රම සංක්‍රමණය (Skilled Labor Migration) | නුපුහුණු ශ්‍රම සංක්‍රමණය (Unskilled Labor Migration) |
|---|---|---|
| ශ්‍රම හිඟය (Labor Shortage) | - වෛද්‍යවරුන්, මහාචාර්යවරුන්, සහ ඉංජිනේරුවන් වැනි ඉහළ වෘත්තිකයන් සීඝ්‍රයෙන් රට හැර යාම නිසා "බුද්ධි ගලනය" (Brain Drain) සිදු වේ.<br>- රෝහල්, විශ්වවිද්‍යාල සහ තාක්ෂණික පර්යේෂණ ආයතනවල විශේෂඥ වෘත්තිකයන්ගේ දැඩි හිඟයක් නිර්මාණය වේ.<br>- සෞඛ්‍ය හා අධ්‍යාපන පද්ධතිය කඩා වැටීම: වෛද්‍යවරුන් සහ මහාචාර්යවරුන් හිඟ වීම නිසා රෝහල්වල ප්‍රතිකාර සේවා අඩාල වන අතර විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය බිඳ වැටේ (මෙය රටට දැඩි ආර්ථික බලපෑමක් එල්ල කරයි) | - ඇඟලුම්, ඉදිකිරීම්, කෘෂිකාර්මික සහ ගෘහ සේවා වැනි සාම්ප්‍රදායික ක්ෂේත්‍රවල නියුතු සාමාන්‍ය ශ්‍රමිකයන් බහුලව විදේශගත වීම සිදු වේ<br>- දේශීය කර්මාන්ත සහ ව්‍යාපාර සඳහා අවශ්‍ය වන මූලික ශ්‍රම සැපයුම හිඟ වීම නිසා දෛනික නිෂ්පාදන ක්‍රියාවලිය අඩාල වේ. |
| සමාජ පිරිවැය (Social Cost) | • ධනාත්මක බාහිරතා අහිමි වීම: මෙම වෘත්තිකයන් සතු විශේෂඥ දැනුම, අත්දැකීම් සහ ඔවුන්ගෙන් සමාජයට නොමිලේ ලැබීමට තිබූ "බාහිරතා" (Positive Externalities) රටට සදහටම අහිමි වී යයි. | • පවුල් සංස්ථාව බිඳ වැටීම: මව හෝ පියා විදේශගත වීම නිසා දරුවන්ට මව්පිය රැකවරණය අහිමි වන අතර, ඔවුන් දෙමාපියන් නොමැතිව හැදී වැඩීමට සිදු වේ<br>• ළමා අපචාර සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්න: නිසි පවුල් රැකවරණයක් නොමැති වීම නිසා දරුවන් විවිධ ළමා අපචාර (Child abuse) වලට ගොදුරු වීමේ අවදානම ඉහළ යයි<br>• අධ්‍යාපනය අඩාල වීම: දරුවන්ගේ අධ්‍යයන කටයුතු පිළිබඳ සොයා බැලීමට කෙනෙකු නොමැති වීමෙන් දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම සිදු වේ<br>• දික්කසාද ඉහළ යාම: දිගුකාලීනව වෙන්ව ජීවත් වීම නිසා පවුල් ආරවුල් ඇති වන අතර සමාජය තුළ දික්කසාද (Divorce) වීම සීඝ්‍රයෙන් ඉහළ යයි. |

IV.

සමාජ ආරක්ෂණ (Social Protection) පද්ධතියක ඇති කාලීන වැදගත්කම

· අවදානමට ලක්විය හැකි ජනතාව ආරක්ෂා කිරීම: රටක් වේගවත් ආර්ථික වර්ධනයක් (Economic growth) කරා ගමන් කරන විට හෝ හදිසි ආර්ථික කම්පනයකට (Economic shock) මුහුණ දෙන විට, සමාජයේ පහළ ස්ථරවල සිටින අවදානමට ලක්විය හැකි පිරිස් (Vulnerable people) දැඩි ලෙස පීඩාවට පත් වේ. ඔවුන්ව දරිද්‍රතාවයෙන් සහ අසමානතාවයෙන් ආරක්ෂා කිරීමට සමාජ ආරක්ෂණ පද්ධතියක් අත්‍යාවශ්‍ය වේ.

ආර්ථික අස්ථාවරත්වයන් කළමනාකරණය: ආර්ථිකයේ ඇති වන විවිධ උච්චාවචනයන් සහ අවදානම් සහගත තත්ත්වයන් (Volatility and Risks) පවුල් සංස්ථාවන්ට සෘජුවම බලපෑම් නොකරන පරිදි කළමනාකරණය කර ගැනීමට මෙමඟින් ආරක්ෂිත වැටක් (Safety net) නිර්මාණය කර දෙයි.

1. සමාජ ආධාර / සහනාධාර (Social Assistance)

· අර්ථ දැක්වීම: කිසිදු දායක මුදලක් ලබා නොගෙන (Non-contributory), දුප්පත්කම සහ අන්ත අසරණභාවයෙන් පවුල් ආරක්ෂා කිරීම සඳහා රජය මඟින් සපයනු ලබන සෘජු මූල්‍ය හෝ ද්‍රව්‍යමය ආධාර සහ සහන වැඩසටහන් වේ.

· ශ්‍රී ලංකාවෙන් උදාහරණ: "අස්වැසුම" (Aswasuma) සුබසාධන ප්‍රතිලාභ වැඩසටහන (හෝ පෙර පැවති සමෘද්ධි දීමනාව), වැඩිහිටි සහ ආබාධිත දීමනා.

2. සමාජ සත්කාර / රැකවරණ සේවා (Social Care)

· අර්ථ දැක්වීම: තමන්වම රැකබලා ගැනීමට නොහැකි, සමාජයේ විශේෂ අවධානය සහ සහයෝගය අවශ්‍ය වන පුද්ගලයන්ගේ සහ පවුල්වල සුභසාධනය වෙනුවෙන් ක්‍රියාත්මක වන සේවාවන් සහ සම්පත් සැපයීමයි.

· ශ්‍රී ලංකාවෙන් උදාහරණ: රජයේ ලියාපදිංචි වැඩිහිටි නිවාස, ළමා නිවාස, පරිවාස සේවා සහ විශේෂ අවශ්‍යතා සහිත (ආබාධිත) තැනැත්තන් රැකබලා ගැනීමේ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.

3. සමාජ රක්ෂණය (Social Insurance)

· අර්ථ දැක්වීම: පුද්ගලයන් සක්‍රීයව රැකියාවල නිරත වන කාලය තුළ ලබා දෙන දායකත්ව මුදල් (Contributory schemes) මත පදනම්ව, වයස්ගත වීම, ආබාධිත වීම, රැකියා අහිමි වීම හෝ සිදුවන මරණයකදී ඔවුන්ගේ පවුල්වලට මූල්‍යමය සුරක්ෂිතතාව සැපයීමයි.

· ශ්‍රී ලංකාවෙන් උදාහරණ: සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවක භාරකාර අරමුදල (ETF), රාජ්‍ය අංශයේ විශ්‍රාම වැටුප් ක්‍රමය, ගොවි සහ ධීවර රක්ෂණ ක්‍රම.

4. ශ්‍රම වෙළෙඳපොළ සහ ඵලදායී අන්තර්ග්‍රහණ වැඩසටහන් (Labour Market & Productive Inclusion)

· අර්ථ දැක්වීම: අවදානමට ලක්විය හැකි පිරිස්වල මානව ප්‍රාග්ධනය වර්ධනය කරමින් (Human Capital), ඔවුන්ට වෘත්තීය පුහුණුව, රැකියා සුරක්ෂිතතාව සහ ස්වයං රැකියා අවස්ථා ලබා දී ඵලදායී ලෙස ශ්‍රම වෙළෙඳපොළට දායක කර ගැනීමයි.

· ශ්‍රී ලංකාවෙන් උදාහරණ: තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC), නයිටා (NAITA) සහ වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) මඟින් පවත්වන නොමිලේ වෘත්තීය පුහුණු පාඨමාලා, ස්වයං රැකියා සඳහා සහනදායී ණය සහ මෙවලම් ලබා දීමේ රාජ්‍ය වැඩසටහන්.

Q10)

| ක්ෂේත්‍රය | අභ්‍යන්තර ස්ථායිතාවය (Internal Stability) | බාහිර ස්ථායිතාවය (External Stability) |
|---|---|---|
| මූලික මිනුම (Measurement) | * මෙය ප්‍රධාන වශයෙන් මැන බලනු ලබන්නේ රටේ උද්ධමනය (Inflation) හෝ මිල ස්ථායිතාවය පදනම් කරගෙනය. | * මෙය ප්‍රධාන වශයෙන් මැන බලනු ලබන්නේ ගෙවුම් ශේෂයේ අස්ථාවරත්වය (BOP Instability) සහ විනිමය අනුපාතිකය පදනම් කරගෙනය. |
| ප්‍රධාන බලපෑම (Main Impact) | * අර්බුදය හේතුවෙන් ලෝක වෙළෙඳපොළේ මිල ගණන් ඉහළ යාම නිසා ආනයනික භාණ්ඩ දේශීය වෙළෙඳපොළ තුළ අතිශය මිල අධික වේ (ආනයනික උද්ධමනය). | * විදේශ විනිමය ගලා ඒම සීමා වීම සහ ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනුවලට බාධා පැමිණීම නිසා ගෙවුම් ශේෂය මත දැඩි පීඩනයක් එල්ල වේ. |
| විස්තරාත්මක උදාහරණ (Examples) | * බොරතෙල් මිල ඉහළ යාම (Crude oil price increases): මැදපෙරදිග ආතතීන් නිසා ලෝක තෙල් මිල වැඩි වන අතර, එය දේශීය ඉන්ධන, ප්‍රවාහන සහ විදුලි පිරිවැය ඉහළ නංවයි.<br>* පොහොර මිල ඉහළ යාම (Fertilizer price increases): රසායනික පොහොර සහ කෘෂිකාර්මික යෙදවුම් ආනයන පිරිවැය ඉහළ යාම නිසා දේශීය කෘෂි නිෂ්පාදන පිරිවැය සහ ආහාර මිල ගණන් වැඩි වේ.<br>* නැව් ගාස්තු සහ රක්ෂණ වාරික ඉහළ යාම (Freight & Insurance costs increase): (අතිරේක උදාහරණය) රතු මුහුදේ පවතින ආරක්ෂක තර්ජන නිසා නැව් ගාස්තු ඉහළ යන අතර, එමඟින් ආනයනික ඖෂධ, යන්ත්‍ර සූත්‍ර සහ අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිල දේශීයව ඉහළ යයි. | * සංචාරක කර්මාන්තයට එල්ල වන සෘණාත්මක බලපෑම (Negative impact on tourism): ගෝලීය වශයෙන් යුද්මය අවදානම සහ ගුවන් ගමන් ගාස්තු ඉහළ යාම නිසා ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින් ප්‍රමාණය අඩු වී විදේශ විනිමය ආදායම පහත වැටේ.<br>* අපනයන ආදායම පහත වැටීම (Decrease in exports): ශ්‍රී ලංකාවේ ප්‍රධානතම "ලංකා තේ" (Ceylon Tea) අපනයන වෙළෙඳපොළවල් වන්නේ රුසියාව, ඉරානය සහ මැදපෙරදිග කලාපයයි. මෙම රටවල පවතින ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය නිසා ලංකාවේ තේ අපනයන ඉල්ලුම සහ ආදායම සීඝ්‍රයෙන් පහත වැටේ. |

ii.

ළඟා කරගෙන ඇති හෝ යහපත් ප්‍රගතියක් පෙන්වන ඉලක්ක (Achieved Goals):

· SDG 3 (නිරෝගී ජීවිතයක් සහ වර්ධනය වූ යහපැවැත්ම): නිදහස් සෞඛ්‍ය සේවාව නිසා අඩු මාතෘ සහ ළදරු මරණ අනුපාතයක් පවත්වා ගැනීම සහ බෝවන රෝග මර්ධනය කිරීම අතින් ඉහළ ප්‍රගතියක් ලබා ඇත.

· SDG 6 (පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව): ජනගහනයෙන් බහුතරයකට පිරිසිදු පානීය ජලය සහ විධිමත් සනීපාරක්ෂක (වැසිකිළි) පහසුකම් සැපයීමට හැකි වී ඇත.

ළඟා කර ගැනීමට අපොහොසත් වී ඇති හෝ පසුබෑමකට ලක්ව ඇති ඉලක්ක (Unachieved Goals):

· SDG 1 (දුප්පත්කම තුරන් කිරීම) සහ SDG 2 (සාගින්න නිවීම/Zero Hunger): මෑතකාලීන ආර්ථික උච්චාවචනයන් නිසා මෙරට දරිද්‍රතා ප්‍රතිශතය සහ කුඩා දරුවන්ගේ මන්දපෝෂණ මට්ටම නැවතත් ඉහළ ගොස් ඇත.

SDG 7 (පිරිසිදු හා දැරිය හැකි බලශක්තිය): තවදුරටත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් (සූර්ය, සුළං) වෙනුවට ගල්අඟුරු සහ ඩීසල් වැනි පොසිල ඉන්ධන මත අධික ලෙස යැපීමට සිදු වීම.

· SDG 8 (යහපත් රැකියා සහ ආර්ථික වර්ධනය): රට තුළ සාර්ව ආර්ථික අස්ථාවරත්වය නිසා නිෂ්පාදනය පහත වැටී රැකියා අහිමි වීම් ඉහළ යාම.

මෙම ඉලක්ක නිසි පරිදි ළඟා කර ගැනීමට නොහැකි වීමට බලපෑ අභියෝග

· රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන හිඟකම (Fiscal Constraints): රට මුහුණ දෙන දැඩි ණය අර්බුදය සහ අයවැය හිඟය නිසා තිරසර සංවර්ධන ව්‍යාපෘති සඳහා දිගුකාලීන ප්‍රාග්ධන ආයෝජන සිදු කිරීමට රජයට මූල්‍යමය ශක්තියක් නොමැති වීම.

· ප්‍රතිපත්තිමය ස්ථාවරත්වයක් නොමැති වීම (Policy Inconsistency): ආණ්ඩු හෝ බලධාරීන් නිරන්තරයෙන් මාරු වීමේදී ජාතික ප්‍රතිපත්ති සහ සැලසුම් අඛණ්ඩව ඉදිරියට ක්‍රියාත්මක නොවීම (උදා: විදුලි මෝටර්රථ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තිය).

· විටින් විට ඇති වන අභ්‍යන්තර සහ බාහිර කම්පන.

iii.

හරිත මූල්‍යකරණය යනු කුමක්ද?

පරිසරයට සිදුවන හානිය අවම කරන සහ තිරසාර සංවර්ධනයට දායක වන පරිසර හිතකාමී ව්‍යාපෘති (උදා: පුනර්ජනනීය බලශක්තිය, කාබනික වගාව, පරිසර දූෂණය පාලනය) සඳහා පමණක් මූල්‍ය පහසුකම් (ණය හා ආයෝජන) ලබා දීමේ ක්‍රියාවලිය හරිත මූල්‍යකරණය ලෙස හැඳින්වේ.

හරිත මූල්‍යකරණය ක්‍රියාත්මක වන ආකාරය (ජාත්‍යන්තර අරමුදල් ලබා ගැනීම):

ශ්‍රී ලංකාව වැනි රටවලට තිරසාර ව්‍යාපෘති සඳහා විශාල ප්‍රාග්ධනයක් නොමැති බැවින්, රජය හෝ දේශීය මූල්‍ය ආයතන විසින් ජාත්‍යන්තර වෙළෙඳපොළට "හරිත බැඳුම්කර" (Green Bonds) නිකුත් කරනු ලබයි.

එමඟින් විදේශීය ආයෝජකයින්ගෙන් අඩු පිරිවැයකට ජාත්‍යන්තර අරමුදල් (International funds) මෙරටට ගෙන්වා ගෙන ඒවා දේශීය හරිත ව්‍යාපෘති සඳහා ආයෝජනය කරනු ලබයි.

දේශීය බැංකුවල මැදිහත්වීම සහ උදාහරණ:

වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ජාතික සංවර්ධන බැංකුව (NDB) වැනි වාණිජ බැංකු මෙම හරිත මූල්‍යකරණ සංකල්පය යටතේ සක්‍රීයව ක්‍රියාත්මක වේ.

බැංකුවේ කාර්යභාරය:

මෙම බැංකු විසින් නිවෙස්වලට හෝ කර්මාන්තශාලාවලට සූර්ය කෝෂ (Solar panels) සවි කිරීම වැනි පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා, සාමාන්‍ය පාරිභෝගික ණය සඳහා අය කරන පොලී අනුපාතයන්ට වඩා ඉතා අඩු සහනදායී පොලී අනුපාතයක් (Lower interest rates) යටතේ ණය පහසුකම් ලබා දීම සිදු කරයි. මෙය හරිත ආයෝජන සඳහා ජනතාව දිරිමත් කිරීමකි.

iv.

එල් නිනෝ තත්ත්වය යනු කුමක්ද?

'එල් නිනෝ' යනු ශාන්තිකර සාගරයේ ජලය අසාමාන්‍ය ලෙස උණුසුම් වීම නිසා ගෝලීය කාලගුණික රටා වෙනස් වී, ඇතැම් රටවලට දැඩි නියඟයන් සහ තවත් රටවලට අධික වර්ෂාපතනයක් / ගංවතුර ඇති කරන අහිතකර ස්වාභාවික දේශගුණික තත්ත්වයකි.

ශ්‍රී ලංකාවට එල්ල වූ බලපෑම (ඓතිහාසික පසුබිම): මෑත කාලීනව 2016-2017 වර්ෂවලදී සහ නැවතත් 2023-2024 කාලයේදී ශ්‍රී ලංකාව එල් නිනෝ තත්ත්වය හේතුවෙන් ඇති වූ දරුණු නියඟයන්ට සහ කාලගුණික කම්පනයන්ට දැඩිව මුහුණ දුන්නේය.

මෙමගින් ක්ෂේත්‍ර 2කට එල්ල වන බලපෑම් පහත පරිදි වේ:

1. කෘෂිකාර්මික අංශයට එල්ල වන බලපෑම:

· එල් නිනෝ තත්ත්වය හේතුවෙන් ඇතිවන දීර්ඝ වියළි කාලගුණය (නියඟය) සහ වර්ෂාපතනය නොමැති වීම නිසා ගොවිබිම් විනාශ වී වී, එළවළු සහ අනෙකුත් භෝග වගාවන් සඳහා අවශ්‍ය ජලය හිඟ වේ. එසේම සත්ත්ව පාලනයට සහ ජලජීවී වගාවට ද බලපෑම් එල්ල වේ.

· මෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය කෘෂිකාර්මික නිමැවුම සහ තේ වැනි ප්‍රධාන අපනයන වතු භෝගවල අස්වැන්න සීඝ්‍රයෙන් පහත වැටී ගොවීන්ගේ ආදායම් මාර්ග සම්පූර්ණයෙන්ම අහිමි වී යයි.

2. ආහාර සුරක්ෂිතතාව කෙරෙහි එල්ල වන බලපෑම:

· කෘෂි නිමැවුම අඩු වීම නිසා දේශීය වෙළෙඳපොළ තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල උග්‍ර හිඟයක් නිර්මාණය වේ.

· සැපයුම සීමා වීම නිසා ආහාර මිල ගණන් අධික ලෙස ඉහළ ගොස් ආහාර උද්ධමනයක් (Food Inflation) ඇති වේ. මෙහිදී අඩු ආදායම්ලාභී සහ අවදානමට ලක්විය හැකි පවුල්වලට පෝෂ්‍යදායී ආහාර මිලදී ගැනීමේ හැකියාව (Affordability) අහිමි වන බැවින් රටේ සමස්ත ආහාර සුරක්ෂිතතාව බිඳවැටී මන්දපෝෂණ තත්ත්වයන් ඉහළ යයි.